# (ආ) කාර්මික සංවර්ධනය

## (අ) පෞද්ගලික අංශය

### නිෂ්පාදනය

### මූලික ලක්ෂණ

මෙම වර්ෂයේදී කාර්මික නිෂ්පාදනය පිළිබඳ සමීක්ෂණයට ඇතුලත් වූ විෂය පථය 1964 දීට වඩා පුළුල් විය. සංඛ්‍යා තොරතුරු ලබා ගන්නා ලද ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 717 සිට 1,381 දක්වා වැඩිවූයේ 92 ක ශුද්ධ වැඩිවීමෙක් පිළිබිඹු විය. මේ අතුරින් ව්‍යාපාරික ආයතන විශාල සංඛ්‍යාවක් ඉකුත් වර්ෂයේ ද පැවති නමුදු ඒවායින් සංඛ්‍යා තොරතුරු ලබාගත නොහැකි විය. මෙම වැඩිවීම කෙරෙහි මූලික වශයෙන්ම හේතුවූයේ II (ආ) අ. 1 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන එක් එක් මූලික ගණයන් තුළ වූ කාර්මික ඒකක පුළුල් ලෙස සමීක්ෂණයට ඇතුලත් කරගැනීම හා 1964 සංඛ්‍යා තොරතුරුවලට ඇතුළත් නොවූ අතිරේක කාර්මික ගණයන් කිහිපයක් ඇතුලත් කිරීමය. කලින් කැරුන සමීක්ෂණවලට විශාල නිෂ්පාදන ඒකක වැඩි කොටසක් ඇතුලත්වී තිබුන අතර 1965 දී කැරුන සමීක්ෂණයට 1964 දී වාර්තා නොකැරුන කුඩා කාර්මික ඒකකයන් ද ඇතුලත් කරන ලදී.

ඉහත සඳහන් පදනම අනුව වාර්තා වූ පරිදි, පවත්නා මිල අනුව කාර්මික නිෂ්පාදන වටිනාකම 1964 සංඛ්‍යාව වූ රුපියල් කෝටි 53·75 සිට 1965 දී රුපියල් කොටි 84·7 දක්වා සියයට 57·6 කින් වැඩිවිය. ඉකුත් වර්ෂයේදී එහි වැඩිවීම සියයට 24·3 ක් විය. මූලික වශයෙන්ම දේශීය පොල් නිෂ්පාදිත වලින් සකස් කැරෙන එලවළු තෙල් හා මේද ගණය, නිෂ්පාදනය කිරීමේ කාර්යයෙන් ඉවත් කොට සලකා බලන කල, නිමැවුමේ වැඩිවීම රුපියල් කෝටි 11·91 ක් හෙවත් සියයට 22·2 ක් වනු ඇත. මෙම වර්ෂයේ සමීක්ෂණ විෂයපථයේ තියුණු වෙනස්වීම හේතුකොටගෙන එක් එක් කාර්මික ගණයේ නිමැවුම වැඩිවීමේ වේගය මැණීම තරමක් දුෂ්කර වෙයි. මෙම කරුණ ඉකුත් වර්ෂයේ පළ කැරුන විශ්ලේෂණයේ ද සඳහන් කර ඇත. නිමැවුම වැඩිවීමේ වේගය මැණීම ඇස්තමේන්තු කිරීමට නොහැකි වුවද, කාර්මික නිෂ්පාදනය පිළිබඳ වඩාත් නිවැරදි ඇස්තමේන්තුවක් ලබාගත හැකි බව පෙනී යනවා ඇත. අපහසුවී ඇත්තේ, පවත්නා ව්‍යවසායයන්හි නිමැවුමේ වර්ධනය හා කලින් සමීක්ෂණවලට විෂය නොවුන කර්මාන්ත ඇතුලත් කිරීම හේතුකොටගෙන මුළු නිමැවුමට එකතුවූ ප්‍රමාණය වෙන්කර දැක්වීමය.

විවිධ ආහාර නිෂ්පාදන වර්ගය යටතේ වාර්තා එවන ලද ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 62 සිට 96 දක්වා වැඩිවිය. සියළුම කාර්මික ගණයන් අතුරින් විශාලම වැඩිවීම වාර්තා වී ඇත්තේ දුම්කොළ ව්‍යාපාරික ආයතන වලය. මේ සංඛ්‍යාව 23 සිට 460 දක්වා වැඩිවිය. ඉකුත් වර්ෂයේදී දුම්කොළ කර්මාන්තය පිළිබඳ සංඛ්‍යා තොරතුරු ලැබුනේ ප්‍රධාන වශයෙන්ම විශාල ඒකක වලිනි. එහෙත් මෙම වර්ෂයේදී එම ගණයේ සුළු නිෂ්පාදකයින් විශාල සංඛ්‍යාවකගෙන් සංඛ්‍යාමය තොරතුරු ලබා ගන්නා ලදී. මෙයට බීඩි හා සුරුට්ටු නිෂ්පාදකයින් ද ඇතුලත් විය. මෙකී සුළු ඒකක ඇතුලත් කිරීමෙන් නිමැවුමට එක් වූයේ රුපියල් කෝටි 0·58 ක් පමණෙකි. 1964 දී රුපියල් කෝටි 4·62 ක්වූ නිමැවුම 1965 දී රුපියල් කෝටි 5·20 දක්වා වැඩිවිය. විස්කෝතු හා කොකෝවා චොකලට් හා රස කැවිලි කාර්මික ගණයෙහි ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 82 සිට 65 දක්වා අඩුවූ නමුදු මුළු නිෂ්පාදනය රුපියල් කෝටි 3·09 සිට රුපියල් කෝටි 3·49 දක්වා වැඩිවිය. මෙම ගණයෙහි ඇතිවූ යථාර්ථානුකූල ක්‍රියා පිළිවෙලින් මෙය පැහැදිලි වෙයි. 1962 න් පසුව මෙම නිෂ්පාදනයට

## 1961 – 65 කාර්මික නිෂ්පාදිත හා

| කාර්මික ගණය | සමාගම් ගණන | | | | | සේවකයන්ගේ ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1961 | 1962 | 1963 | 1964 | 1965 |
| I. විවිධ ආහාර නිෂ්පාදිත .. .. | 52 | 57 | 60 | 62 | 96 | 2624 | .3151 | 3433 | 3520 | 3622 |
| II. එළවළු තෙල් සහ මේද .. .. | — | — | — | — | 43 | — | — | — | — | 3770 |
| III. කල් තබා ගත් සහ ටින්වල අසුරන ලද එළවළු, මස්, මාළු සහ මුහුදින් ලැබෙන අනෙකුත් ආහාර .. .. .. | 9 | 14 | 16 | 32 | 33 | 149 | 208 | 238 | 358 | 453 |
| IV. විස්කෝතු, සහ කොකෝවා, චොකලට් සහ රස කැවිලි .. .. .. | 39 | 49 | 62 | 82 | 65 | 1302 | 1699 | 2065 | 2590 | 2927 |
| V. සිසිල් බීම සහ අංගාරික ජලය .. | 23 | 24 | 25 | 33 | 29 | 939 | 949 | 988 | 1088 | 1343 |
| VI. බීර සහ ස්ටවුට් .. .. | 1 | 1 | 1 | 1 | 1 | 198 | 309 | 303 | 300 | 338 |
| VII. දුම්කොළ .. .. | 23 | 23 | 23 | 23 | 460 | 3664 | 3955 | 3960 | 4214 | 8235 |
| VIII. ගොතනලද ඇඳුම් පැලඳුම් සහ මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. | 24 | 32 | 34 | 103 | 110 | 2787 | 3947 | 4500 | 6955 | 6341 |
| IX. නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිමා කිරීම .. | — | — | — | — | 66 | — | — | — | — | 9650 |
| X. පාවහන් හා හම් නිෂ්පාදිත .. .. | 9 | 10 | 11 | 36 | 52 | 1289 | 1421 | 1616 | 1990 | 2130 |
| XI. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) .. | 18 | 20 | 20 | 24 | 27 | 964 | 1022 | 1177 | 1304 | 1435 |
| XII. විවිධ රසායනික නිෂ්පාදිත .. .. | 37 | 56 | 70 | 96 | 123 | 1740 | 2070 | 2498 | 3306 | 4946 |
| XIII. කඩදාසි, කඩදාසි භාණ්ඩ සහ කඩදාසි බෝඩ .. | 21 | 28 | 33 | 57 | 60 | 892 | 1139 | 1316 | 2187 | 2347 |
| XIV. ලෝහ නිෂ්පාදිත .. .. .. | 23 | 26 | 28 | 92 | 98 | 593 | 770 | 676 | 2629 | 3365 |
| XV. විදුලි යන්ත්‍ර සූත්‍ර උපකරණ, මෙවලම් හා සැපයුම් . | — | — | — | — | 26 | — | — | — | — | 1126 |
| XVI. සකස් කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන්) .. .. .. | 30 | 41 | 44 | 69 | 75 | 499 | 616 | 671 | 1058 | 1742 |
| XVII. පිහන් බඩු .. .. .. | 1 | 1 | 1 | 1 | 1 | 193 | 240 | 261 | 300 | 253 |
| XVIII. තුනී ලෑලි .. .. .. | 1 | 1 | 1 | 1 | 1 | 490 | 554 | 579 | 611 | 624 |
| XIV. ඛනිජ වැලි .. .. .. | 1 | 1 | 1 | 1 | 1 | 91 | 102 | 83 | 105 | 120 |
| XX. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය .. .. | 1 | 1 | 1 | 1 | 1 | 164 | 197 | 199 | 200 | 200 |
| XXI. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝ නිෂ්පාදිත .. .. | 2 | 2 | 2 | 3 | 13 | 1410 | 1512 | 1541 | 1507 | 1868 |
| එකතුව .. .. | 315 | 387 | 433 | 717 | 1381 | 19,988 | 23,861 | 26,304 | 34,222 | 56,835 |

සංඛ්‍යා සටහන II (ආ) අ 1

## රක්ෂිරක්ෂා සංඛ්‍යා සංපිණ්ඩනය

| මුළු මිනිස් දවස් (දහස් ගණනින්) | | | | | වැටුප් ලැයිස්තුව (රු. දශලක්ෂ) | | | | | නිෂ්පාදන වටිනාකම (රු. දශ ලක්ෂ) | | | | | මිනිස් දවසක වැටුප (රුපියල්) | | | | | සේවකයෙකුට මිනිස් දවස් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1961 | 1962 | 1963 | 1964 | 1965 |
| 664 | 797 | 871 | 901 | 1070 | 4·7 | 5·4 | 5·8 | 6·0 | 5·1 | 146·9 | 147·8 | 147·6 | 160·7 | 109·2 | 7·08 | 6·77 | 6·62 | 6·65 | 4·80 | 253 | 253 | 254 | 256 | 295 |
| — | — | — | — | 936 | — | — | — | — | 4·0 | — | — | — | — | 190·4 | — | — | — | — | 4·29 | — | — | — | — | 269 |
| 42 | 58 | 67 | 97 | 120 | 0·2 | 0·2 | 0·3 | 0·4 | 0·5 | 1·6 | 2·3 | 3·4 | 3·8† | 5·4 | 3·95 | 4·16 | 4·30 | 4·63 | 4·22 | 282 | 279 | 282 | 271 | 265 |
| 395 | 487 | 591 | 693 | 795 | 1·3 | 1·6 | 2·3 | 2·6 | 2·9 | 18·2 | 21·9 | 28·8 | 30·9 | 34·9 | 3·36 | 3·36 | 3·94 | 3·78 | 3·65 | 303 | 287 | 286 | 268 | 272 |
| 273 | 275 | 284 | 316 | 367 | 2·1 | 2·1 | 2·1 | 2·5 | 2·9 | 7·8 | 10·0 | 11·4 | 13·4 | 16·0 | 7·62 | 7·56 | 7·54 | 8·00 | 8·64 | 291 | 290 | 287 | 294 | 273 |
| 61 | 67 | 68 | 84 | 92 | 0·3 | 0·4 | 0·4 | 0·5 | 0·8 | 2·4 | 2·2 | 2·4 | 2·7 | 7·6 | 5·34 | 5·19 | 5·45 | 5·50 | 8·22 | 30[illegible] | 309 | 303 | 280 | 273 |
| 1023 | 1104 | 1104 | 1175 | 2141 | 8·3 | 9·2 | 9·6 | 10·1 | 19·0 | 29·0 | 35·0 | 39·0 | 46·2 | 52·0 | 8·12 | 8·37 | 8·66 | 3·64 | 8·71 | 279 | 279 | 279 | 279 | 260 |
| 816 | 1102 | 1261 | 1749 | 1541 | 2·9 | 3·9 | 4· | 6·9 | 6·4 | 19·8 | 29·3 | 38·4 | 54·9 | 55·5 | 3·56 | 3·56 | 3·43 | 3·93 | 4·15 | 793 | 279 | 280 | 251 | 243 |
| — | — | — | — | 2601 | — | — | — | — | 9·9 | — | — | — | — | 91·3 | — | — | — | — | 3·54 | — | — | — | — | 290 |
| 348 | 373 | 419 | 538 | 590 | 2·4 | 3·0 | 3·3 | 4·5 | 4·6 | 8·5 | 19·6 | 22·3 | 23·4 | 24·7 | 6·80 | 7·96 | 7·86 | 8·30 | 7·75 | 270 | 262 | 259 | 270 | 277 |
| 264 | 293 | 377 | 361 | 396 | 1·5 | 1·7 | 2·3 | 1·9 | 2·0 | 8·3 | 10·9 | 13·7 | 17·0 | 19·1 | 5·63 | 5·81 | 6·10 | 5·21 | 5·15 | 279 | 287 | 320 | 277 | 276 |
| 492 | 609 | 673 | 884 | 1331 | 3·2 | 3·8 | 4·6 | 6·4 | 9·4 | 40·3 | 51·5 | 56·0 | 73·7 | 91·2 | 7·25 | 6·33 | 6·90 | 7·21 | 7·08 | 282 | 295 | 270 | 267 | 269 |
| 226 | 300 | 374 | 638 | 667 | 2·0 | 2·5 | 2·9 | 3·8 | 4·1 | 13·9 | 15·4 | 18·3 | 30·1 | 29·3 | 8·77 | 8·29 | 7·70 | 5·93 | 6·15 | 253 | 263 | 284 | 292 | 284 |
| 166 | 217 | 240 | 743 | 926 | 0·9 | 1·3 | 1·2 | 4·1 | 5·2 | 9·1 | 11·2 | 15·1 | 38·5 | 44·7 | 4·98 | 5·11 | 5·17 | 5·52 | 5·57 | 279 | 272 | 270 | 283 | [illegible]75 |
| — | — | — | — | 263 | — | — | — | — | 1·9 | — | — | — | — | 14·0 | — | — | — | — | 7·19 | — | — | — | — | 234 |
| 137 | 167 | 191 | 279 | 415 | 0·5 | 0·6 | 0·8 | 1·2 | 1·6 | 3·7 | 4 3 | 5·8 | 11·0 | 14·7 | 3·56 | 3·75 | 4·11 | 4·31 | 3·96 | 275 | 271 | 285 | 264 | 238 |
| 57 | 66 | 81 | 86 | 71 | 0·4 | 0·5 | 0·6 | 0·8 | 0·8 | 1·1 | 1·9 | 2·5 | 2·4 | 2·4 | 7·46 | 7·95 | 7·79 | 8·68 | 11·50 | 294 | 276 | 259 | [illegible]88 | 253 |
| 153 | 177 | 185 | 171 | 187 | 0·9 | 1·4 | 1·4 | 1·3 | 1·8 | 2·9 | 3·4 | 3·9 | 3·9 | 5·2 | 6·10 | 7·65 | 7·65 | 7 70 | 9·48 | 313 | 320 | 320 | 280 | 300 |
| 25 | 33 | 23 | 33 | 36 | 0·2 | 0·3 | 0·2 | 0·3 | 0·2 | 0·1 | 0·1 | 0·1 | 0·9 | 1·3 | 8·49 | 7·95 | 6·81 | 7·52 | 6·12 | 276 | 324 | 282 | 312 | 300 |
| 49 | 59 | 62 | 62 | 65 | 0·4 | 0·5 | 0·5 | 0·6 | 0·6 | 0·2 | 1·1 | 1·2 | 1·0 | 1·6 | 7·82 | 7·60 | 7·61 | 8·06 | 8·61 | 297 | 301 | 311 | 310 | 325 |
| 41 | 442 | 440 | 470 | 526 | 3·1 | 3· | 3·4 | 3·5 | 4·9 | 17·9 | 20·2 | 22·5 | 23·0 | 36·5 | 7·80 | 7·80 | 7·79 | 7·33 | 9·29 | 312 | 312 | 312 | 312 | 282 |
| 5605 | 6620 | 7301 | 9280 | 15,336 | 35·3 | 41·8 | 46·0 | 57·4 | 88·6 | 331·7 | 880·3 | 432·4 | 537·5† | 847·0 | 6·19 | 6·31 | 6·30 | 6·19 | 5·78 | 280 | 277 | 278 | 271 | 270 |

සංඛ්‍යා ශ්‍රී ලංකා මහ බැංකුව

එළඹුන ව්‍යාපාරික ආයතන සංඛ්‍යාවේ ශීඝ්‍ර වැඩිවීමෙක් දක්නට ලැබිණි. එහෙත්, තරඟය වැඩිවත්ම නිෂ්පාදන ශක්තියෙන් අඩු ඒකක ව්‍යාපාරය විශාල ඒකකයන්ට බාරකොට නිෂ්පාදනයෙන් ඉවත්වන්නට විය. මෙම විශාල ඒකක දේශීය වෙළෙඳ පොළෙහි තම කොටස වැඩි කිරීමට හැකිවූ වඩා හොඳ තත්ත්වයක පැවතුනි. මෙම ගණයේ නිෂ්පාදිතවල සිල්ලර මිල වර්ෂය තුළදී එතරම් වෙනස්වූයේ නැත. ඉහළ මට්ටමේ නිමැවුමක් හා ඒ හේතුකොටගෙන අභ්‍යන්තර හා බාහිර පිරිමැසුම් ඇතිවීමෙන් මිල අඩු වීමට ඉඩකඩ සැලැසුන බැව් පෙනීයයි. සිසිල්බීම ගණයෙහි ද මෙවැනිම තත්ත්වයක් දක්නට ලැබුනේය. එහි ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 33 සිට 29 දක්වා අඩුවූ අතර නිෂ්පාදන වටිනාකම රුපියල් කෝටි 1·34 සිට රුපියල් කෝටි 1·6 දක්වා වැඩිවිය.

පාවහන් හා සම් නිෂ්පාදන කර්මාන්තයේ ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 36 සිට 52 දක්වා වැඩිවූ අතර නිමැවුම් වටිනාකම රුපියල් කෝටි 2·34 සිට රුපියල් කෝටි 2·47 දක්වා වැඩිවිය. මෙම කාර්මික ගණයේ නිමැවුමෙහි ප්‍රාසාරණය 1964 න් පසු මුළුමනින්ම තුන්ගුණයක්වූ අතර, එය, පාවහන් හා සම් නිෂ්පාදිත සඳහා වූ දේශීය වෙළෙඳ පොළ ව්‍යාප්තවීම හඟවන්නක් විය. මෙම වර්ෂයේදී කැරුන සමීක්ෂණයට අනුව, වාර්තා එවන ලද විවිධ රසායනික නිෂ්පාදිත නිපදවන ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 96 සිට 123 දක්වා වැඩිවිය. ගෙතූ ඇඳුම්, මසන ලද ඇඳුම් හා පැලඳුම් නිපද වූ ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 1964 සංඛ්‍යාවවූ 103 සිට 1965 දී 110 දක්වා වැඩිවූ අතර නිමැවුම් වටිනාකම රුපියල් කෝටි 5·49 සිට රුපියල් කෝටි 5·55 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. ලෝහ නිෂ්පාදිත නිපදවන ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 92 සිට 98 දක්වා වැඩිවූ අතර නිමැවුම් වටිනාකම රුපියල් කෝටි 3·85 සිට රුපියල් කෝටි 4·47 දක්වා වැඩිවිය. මෙම වර්ග තුන අතරින් වැඩිම ව්‍යාපාරික ආයතන සංඛ්‍යාවක් ඇතුළත් වූයේ විවිධ රසායනික නිෂ්පාදිත සම්බන්ධයෙන් පමණකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1964 දී රුපියල් කෝටි 7·37 ක්වූ නිමැවුම 1965 දි රුපියල් කෝටි 9·12 දක්වා සැලකිය යුතු අන්දමින් වැඩිවිය. එසේ වුවද, අනෙකුත් ඒවායේ වෙනස්වීම සැලකිය යුතු නොවීය. මීට ඉහත දී සමීක්ෂණ පථයට ලක් නොවූ අලුත් කාර්මික ගණයක්, එනම්, විදුලි යන්ත්‍ර සූත්‍ර, උපකරණ, මෙවලම් හා සැපැයුම් ද මෙවර සමීක්ෂණයට ඇතුළත් කරනු ලැබිණි. 1965 දී කර්මාන්ත 16 කින් වාර්තා ලබාගන්නා ලද අතර ඒවායේ නිමැවු මෙහි වටිනාකම රුපියල් කෝටි 1.4 ක් විය. II (ආ) අ. 1 සංඛ්‍යා සටහනෙහි දක්වන ලද පරිදි, ප්‍රධාන .වශයෙන්ම ප්ලාස්ටික් භාණ්ඩ ඇතුලත්වූ, අන් තැනෙක සඳහන් නොවූ නිෂ්පාදන ද්‍රව්‍ය නිපදවන ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 1964 සංඛ්‍යාව වූ 69 සිට 75 දක්වා වැඩිවිය. මෙම ගණයෙහි නිමැවුම් වටිනාකම 1964 සංඛ්‍යාව වූ රුපියල් කෝටි 1·1සිට 1965 දී රුපියල් කෝටි 1·47 දක්වා වැඩිවිය.

II (ආ) අ. 1 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන xvii සිට xx දක්වා වූ ගණයන් ප්‍රධාන වශයෙන්ම සම්බන්ධවනුයේ පිඟන් බඩු, තුනී ලැලි, ඛණිජ වැලි හා කාර්මික රසායන ද්‍රව්‍ය නිපදවීමෙහි නියුතු රජයේ කාර්මික සමායතනවලට ය. මෙම කර්මාන්තවල නිෂ්පාදන හැඩගැස්ම පිළිබඳව පසුව එන "රාජ්‍ය අංශය" නමැති කොටසේදී සාකච්ඡා කරනු ලැබේ. 1965 දී සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත හා ඇස්බැස්ටෝ නිෂ්පාදිත නිපදවන ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 3 සිට 13 දක්වා වැඩිවූ අතර නිෂ්පාදන වටිනාකම 1964 සංඛ්‍යාව වූ රුපියල් කෝටි 2·3 සිට රුපියල් කෝටි 3·65 දක්වා වැඩිවිය. ඉතා වැදගත් කාර්මික ගණයක් වන නූල් කැටීම රෙදිපිළි විවීම හා නිමා කිරීම පිළිබඳවද ප්‍රථම වරට සංඛ්‍යා තොරතුරු ලබාගනු ලැබිණි. මෙම ගණය යටතට වැටුනු ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 66 ක්වූ අතර 1965 දී ඒවායේ මුළු නිෂ්පාදන වටිනාකම රුපියල් කෝටි 9·13 ක් විය.

මුළු නිමැවුම් වටිනාකම සම්බන්ධයෙන් II (ආ) අ. 1 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති සංඛ්‍යා තවමත් ඌන ඇස්තමේන්තු විය හැකිය. ඒ මක්නිසාද යතහොත්, මෙම ප්‍රධාන ගණයන් එකිනෙක තුළ එම සංඛ්‍යාවන්ට ඇතුලත් නොවුන කුඩා කාර්මික ඒකක කිහිපයක් තිබිය හැකි බැවිනි. වඩා පුළුල් විෂය පථයක් ඇතුලත් වී තිබීම හැරෙන්නට, සියළුම කාර්මික ගණයන්හි ම වාගේ නිෂ්පාදනයෙහි ව්‍යාප්තියක් ඇතිවී තිබෙන බවද මෙම සමීක්ෂණයෙන් පෙනී යයි.

**නිෂ්පාදනය කර්මාන්ත වර්ග අනුව**

කාර්මික නිෂ්පාදනයේ වටිනාකම, කර්මාන්ත හා ප්‍රධාන නිෂ්පාදිත වර්ග අනුව II (ආ) අ. 2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. ආහාරයට ගන්නා තෙල් හා මේද වෙනම ගණයක් වශයෙන් වෙන්කර තිබීම නිසා, පළමු ගණය වන විවිධ ආහාර නිෂ්පාදිත නිමැවුමෙහි මුළු වටිනාකම 1965 දී අඩුවී ඇත් බැව් පෙනීයයි. එසේ වුවද, එක් එක් උපගණයන්හි නිමැවුම් වටිනාකම සැලකිය යුතු පරිදි වැඩිවී ඇති බැව් පෙනීයයි. කපාපු පොල් නිමැවුම රුපියල් කෝටි 1·32 සිට රුපියල් කෝටි 6·22 දක්වා වැඩිවූ අතර, කිරි ආහාර නිෂ්පාදනය රුපියල් කෝටි 0·49 සිට රුපියල් කෝටි 1·30 දක්වා වැඩිවිය. විස්කෝතු හා කොකෝවා, චොකලට් හා රස කැවිලි ගණයෙහි විස්කෝතු නිමැවුම රුපියල් කෝටි 1·64 සිට රුපියල් කෝටි 1·48 දක්වා පහළ වැටුන අතර සීනිබෝල, චොකලට් හා ටොෆි නිමැවුමෙහි වටිනාකම තරමක් වැඩිවිය.

1964 දී රුපියල් කෝටි 0·27 ක්වූ බීර හා ස්ටවුට් නිමැවුම 1965 දී රුපියල් කෝටි 0·76 දක්වා වැඩිවිය. මෙම සංඛ්‍යා එක ස්කාගාරයක නිෂ්පාදනය සම්බන්ධයෙනි. වර්ෂය තුළදී තවත් ස්කාගාරයකින් නිෂ්පාදනය ඇරඹුන නමුදු එහි නිමැවුම පිළිබඳ.විස්තර.වාතීකර නොමැත. සිසිල් බීම.හා අංගාරික ජලය නිෂ්පාදනයෙහි ද සුළු වැඩිවීමක් දක්නට ලැබිණි. වර්ෂය තුලදී කම්ස නිමැවුම රුපියල් කෝටි 2 54 සිට රුපියල් කෝටි 3.03 දක්වා වැඩිවූ අතර ප්‍රධාන වශයෙන්ම බැනියම් ඇතුළු අනෙකුත් මසන ලද ඇදුම් නිෂ්පාදනය නොවෙනස්වම වාගේ රුපියල් කෝටි 2·52 හි.පැවතිණි. මෙම එක් එක් ගණයන්හි නිෂ්පාදන රටාවේ වෙනස්වීම කෙරෙහි පාරිභෝගික ඉල්ලුමෙහි ඇතිවූ වෙනස්කම් බලපෑවා විය හැකිය. බීර හා ස්ටවුට් නිමැවුම වැඩිවූයේ දේශිය පාරිභෝගික ඉල්ලුම වැඩිවීම හේතුකොට ගෙනය. වැඩිවූ කම්ස නිමැවුමෙහි එක්තරා කොටසක් අලුතින් විවෘත වුන අපනයන වෙළෙඳ පොළවල් කරා ඇදී ගියේය. ඖෂධ නිෂ්පාදනය 1964 සංඛ්‍යාව වූ රුපියල් කෝටි 0·52 සිට 1965 දී රුපියල් කෝටි 0·95 දක්වා වැඩිවිය. සබන් හා රසායනික සංයෝග නිමැවුම රුපියල් කෝටි 3·90 සිට රුපියල් කෝටි 4·76 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම නිෂ්පාදිතවල නිමැවුම වැඩිවීම කෙරෙහි බොහෝසෙයින්ම හේතු වූයේ දේශීය වෙළෙඳ පොළ ව්‍යාප්තවීමය. වැඩි වශයෙන්ම අභ්‍යාස පොත් සෑදීම සඳහා ගනු ලබන, ලියන කඩදාසි නිමැවුම 1964 සංඛ්‍යාව වූ රුපියල් කෝටි 1·21 සිට 1965 දී රුපියල් කෝටි 1·04 දක්වා තරමක් පහළ වැටුනේය. 1963 දී එහි නිමැවුම් වටිනාකම රුපියල් කෝටි 0·89 ක් වූයේය. වර්ෂය තුළදී ලියන කඩදාසි නිමැවුම අඩුවීම හේතුකොටගෙන, වෙළෙඳ පොළෙහි අභ්‍යාස පොත් සැපයීමේ කැපී පෙනෙන හිගයක් ඇතිවිය. විශේෂයෙන්ම 1965 අවසාන කාර්තුවේදී එවැනි තත්ත්වයක් ඇතිවූයේය. මුද්‍රණ කඩදාසි නිමැවුම නොවෙනස්වම වාගේ පැවතුන අතර එහි වටිනාකම රුපියල් කෝටි 0·39 ක් විය. කාටන් හා අනෙකුත් අහුරන පෙට්ටි නිමැවුම රුපියල් කෝටි 0·46 සිට රුපියල් කෝටි 0·59 දක්වා වැඩිවිය. කාටන් හා අහුරන පෙට්ටි නිෂ්පාදන කර්මාන්තය 1964 දී හා 1965 දී ඉතාමත් කැපී පෙනෙන ලෙස ව්‍යාප්ත විය. 1963 ඒවායේ නිමැවුම රුපියල් කෝටි 0·17 ක් පමණක් විය. කාටන් හා පෙට්ටි සෑදීමේ

## සංඛ්‍යා සටහන II (අ) අ. 2

# 1961/65 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම - කර්මාන්ත හා ප්‍රධාන නිෂ්පාදිත අනුව වර්ග කොට

| | වටිනාකම (රු. දශ ලක්ෂ) | | | | | කර්මාන්තයෙහි සියයට ගණන | | | | | මුළු කාර්මික නිෂ්පාදනයේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1961 | 1962 | 1963 | 1964 | 1965 |
| i. විවිධ ආහාර නිෂ්පාදිත | 146.9 | 147.8 | 147.6 | 160.7 | 109.2 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 44.3 | 38.1 | 34.2 | 29.9 | 12.8 |
| කිරි ආහාර | 3.5 | 3.0 | 4.1 | 4.9 | 13.0 | 2.4 | 2.0 | 2.8 | 3.0 | 11.9 | 1.1 | 0.8 | 0.9 | 0.9 | 1.5 |
| ගව හා කුකුල් ආහාර | 17.3 | 18.4 | 19.6 | 23.5 | 26.4 | 11.8 | 12.4 | 13.3 | 14.6 | 24.2 | 5.2 | 4.7 | 4.5 | 4.4 | 3.1 |
| කපාපු පොල් | 8.8 | 11.4 | 11.0 | 13.2 | 62.2 | 6.0 | 7.7 | 7.5 | 8.2 | 57.0 | 2.7 | 2.9 | 2.5 | 2.5 | 7.3 |
| * ආහාරයට ගන්නා තෙල් හා මේද | 111.7 | 110.7 | 109.0 | 14.4 | — | 76.0 | 74.9 | 73.8 | 71.2 | — | 33.7 | 28.5 | 25.2 | 21.3 | — |
| ලුණු | 2.7 | 0.7 | 0.4 | 0.5 | 1.5 | 1.8 | 0.5 | 0.3 | 0.3 | 1.4 | 0.8 | 0.2 | 0.1 | 0.1 | 0.2 |
| අයිස් | 1.2 | 1.4 | 1.1 | 1.3 | 1.8 | 0.8 | 0.9 | 0.7 | 0.8 | 1.6 | 0.4 | 0.4 | 0.3 | 0.2 | 0.2 |
| අනෙකුත් | 1.7 | 2.2 | 2.4 | 2.9 | 4.3 | 1.2 | 1.5 | 1.6 | 1.8 | 3.9 | 0.5 | 0.6 | 0.6 | 0.5 | 0.5 |
| ii. එලවළු තෙල් සහ මේද | — | — | — | — | 190.4 | — | — | — | — | 100.0 | — | — | — | — | 22.5 |
| iii. කල්තබාගත් සහ ටින්වල අසුරන ලද එලවළු, මස්, මාළු සහ මුහුදින් ලැබෙන අනෙකුත් ආහාර | 1.6 | 2.3 | 3.4 | 3.8† | 5.4 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 0.5 | 0.6 | 0.8 | 0.7† | 0.6 |
| ජෑම්, ජෙලි සෝස්සස් යනාදිය | 0.5 | 0.9 | 2.2 | 2.3 | 3.4 | 31.3 | 39.1 | 64.7 | 60.5 | 63.0 | 0.2 | 0.2 | 0.5 | 0.4 | 0.4 |
| අනෙකුත් | 1.1 | 1.3 | 1.2 | 1.5 | 2.0 | 69.7 | 61.8 | 35.2 | 39.5 | 37.0 | 0.3 | 0.3 | 0.3 | 0.3 | 0.2 |
| iv. විස්කෝතු සහ කොකෝවා, චොකලට් සහ රස කැවිලි | 18.2 | 21.9 | 28.8 | 30.9 | 34.9 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 5.5 | 5.6 | 6.7 | 5.7 | 4.1 |
| විස්කෝතු | 10.5 | 12.7 | 15.7 | 16.4 | 14.8 | 57.7 | 58.0 | 54.5 | 53.1 | 42.4 | 3.2 | 3.3 | 3.6 | 3.0 | 1.7 |
| සීනි බෝල | 3.4 | 5.1 | 6.6 | 5.5 | 7.6 | 18.7 | 23.3 | 22.9 | 17.8 | 21.8 | 1.0 | 1.3 | 1.5 | 1.0 | 0.9 |
| චොකලට් හා ටොෆි | 0.7 | 1.3 | 3.1 | 5.5 | 10.0 | 3.8 | 5.9 | 10.8 | 17.2 | 28.6 | 0.2 | 0.3 | 0.7 | 1.0 | 1.2 |
| අනෙකුත් | 3.5 | 2.8 | 3.4 | 3.5 | 2.5 | 19.2 | 12.8 | 11.8 | 11.3 | 7.2 | 1.1 | 0.7 | 0.8 | 0.7 | 0.3 |
| v. සිසිල් බීම සහ අංගාරික ජලය | 7.8 | 10.0 | 11.4 | 13.4 | 16.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 2.4 | 2.6 | 2.6 | 2.5 | 1.9 |
| vi. බීර සහ ස්ටවුට් | 2.4 | 2.2 | 2.4 | 2.7 | 7.6 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 0.7 | 0.6 | 0.6 | 0.5 | 0.9 |
| vii. දුම්කොළ | 29.0 | 35.0 | 39.0 | 46.2 | 52.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 8.7 | 9.0 | 9.0 | 8.6 | 6.1 |
| viii. ගොතන ලද ඇඳුම් පැලඳුම් සහ මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) | 19.8 | 29.3 | 38.4 | 54.9 | 55.5 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 6.0 | 7.6 | 8.9 | 10.2 | 6.6 |
| කමිස | 7.3 | 14.2 | 20.7 | 25.4 | 30.3 | 36.9 | 48.5 | 53.9 | 46.3 | 54.6 | 2.2 | 3.7 | 4.8 | 4.7 | 3.6 |
| අනෙකුත් (ප්‍රධාන වශයෙන් බැනියන්) | 12.5 | 15.1 | 17.7 | 29.5 | 25.2 | 63.1 | 51.5 | 46.1 | 53.7 | 45.4 | 3.8 | 3.9 | 4.1 | 5.5 | 3.0 |
| ix. නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිමකිරීම | — | — | — | — | 91.3 | — | — | — | — | 100.0 | — | — | — | — | 10.8 |
| x. පාවහන් හා හම් නිෂ්පාදිත | 8.5 | 19.6 | 22.3 | 23.4 | 24.7 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 2.6 | 5.1 | 5.2 | 4.3 | 2.9 |
| xi. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) | 8.3 | 10.9 | 13.7 | 17.0 | 19.1 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 2.5 | 2.8 | 3.2 | 3.2 | 2.3 |
| ටයර් නැවත පිරවීම | 5.3 | 6.8 | 9.1 | 11.0 | 11.1 | 63.9 | 62.4 | 66.4 | 64.7 | 58.1 | 1.6 | 1.8 | 2.1 | 2.0 | 1.3 |
| සයිකල් ටයර් හා ටියුබ් | 1.7 | 2.6 | 2.7 | 4.2 | 4.9 | 20.5 | 23.9 | 19.7 | 24.7 | 25.7 | 0.5 | 0.7 | 0.6 | 0.8 | 0.6 |
| අනෙකුත් | 1.3 | 1.5 | 2.0 | 1.8 | 3.1 | 15.7 | 13.8 | 14.6 | 10.6 | 16.2 | 0.4 | 0.4 | 0.5 | 0.3 | 0.4 |
| xii. විවිධ රසායනික නිෂ්පාදිත | 40.3 | 51.5 | 56.0 | 73.7 | 91.2 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 12.1 | 13.3 | 13.0 | 13.7 | 10.8 |
| ඖෂධ (ග්ලිසරින් ඇතුළු) | 2.5 | 1.9 | 4.2 | 5.2 | 9.5 | 6.2 | 3.7 | 7.5 | 7.1 | 10.4 | 0.8 | 0.5 | 1.0 | 1.0 | 1.1 |
| විලේපන | 1.7 | 3.5 | 5.6 | 6.2 | 7.5 | 4.2 | 6.8 | 10.0 | 8.4 | 8.2 | 0.5 | 0.9 | 1.3 | 1.2 | 0.9 |
| සබන් සහ පවිත්‍ර කිරීමේ සංයෝග | 28.1 | 35.1 | 34.0 | 39.0 | 47.6 | 69.7 | 68.2 | 60.7 | 52.9 | 52.2 | 8.5 | 9.0 | 7.9 | 7.2 | 5.6 |
| ගිණි පෙට්ටි | 3.8 | 5.6 | 4.5 | 10.3 | 12.3 | 9.4 | 10.9 | 8.0 | 14.0 | 13.6 | 1.1 | 1.4 | 1.0 | 1.9 | 1.5 |
| දන්තාලේප | 2.2 | 2.2 | 2.9 | 3.3 | 3.4 | 5.5 | 4.3 | 5.2 | 4.5 | 3.7 | 0.7 | 0.6 | 0.7 | 0.6 | 0.4 |
| අනෙකුත් | 2.0 | 3.2 | 4.8 | 9.7 | 10.9 | 5.0 | 6.2 | 8.6 | 13.2 | 12.0 | 0.6 | 0.8 | 1.1 | 1.8 | 1.3 |
| xiii. කඩදාසි, කඩදාසි භාණ්ඩ සහ කඩදාසි බෝඩ් | 13.9 | 15.4 | 18.2 | 30.1 | 29.3 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 4.2 | 4.0 | 4.2 | 5.6 | 3.4 |
| ලියන කඩදාසි (කොපි පොත් ආදිය ඇතුළුව) | 5.1 | 6.6 | 8.9 | 12.1 | 10.4 | 36.7 | 44.2 | 48.9 | 40.2 | 35.5 | 1.5 | 1.8 | 2.1 | 2.2 | 1.2 |
| මුද්‍රණ කඩදාසි | 5.9 | 4.2 | 3.1 | 3.9 | 3.8 | 42.4 | 27.3 | 17.0 | 13.0 | 13.0 | 1.8 | 1.1 | 0.7 | 0.7 | 0.4 |
| කාඩ්බෝඩ් සහ අනෙකුත් අසුරන පෙට්ටි | 0.5 | 0.7 | 1.7 | 4.6 | 5.9 | 3.6 | 4.5 | 9.3 | 15.3 | 20.1 | 0.2 | 0.2 | 0.4 | 0.9 | 0.7 |
| ඔතන කඩදාසි | 0.5 | 0.5 | 1.2 | 2.3 | 3.4 | 3.6 | 3.2 | 6.6 | 7.6 | 11.6 | 0.2 | 0.1 | 0.3 | 0.4 | 0.4 |
| අනෙකුත් | 1.9 | 3.2 | 3.3 | 7.2 | 5.8 | 13.7 | 20.8 | 18.1 | 23.9 | 19.8 | 0.6 | 0.8 | 0.8 | 1.3 | 0.7 |
| xiv. ලෝහ නිෂ්පාදිත | 9.1 | 11.2 | 15.1 | 38.5 | 44.7 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 2.7 | 2.9 | 3.5 | 7.2 | 5.3 |
| ඇලුමිනියම් භාණ්ඩ | 4.5 | 5.3 | 7.3 | 9.2 | 9.0 | 49.5 | 47.3 | 48.3 | 23.9 | 20.1 | 1.4 | 1.4 | 1.7 | 1.7 | 1.1 |
| ලෝහ භාජන | 1.5 | 2.7 | 2.1 | 4.9 | 9.3 | 16.5 | 24.1 | 13.9 | 12.7 | 20.8 | 0.5 | 0.7 | 0.5 | 0.9 | 1.1 |
| කටු කම්බි | 0.2 | 0.7 | 1.1 | 3.0 | 3.1 | 2.3 | 6.3 | 7.3 | 7.8 | 7.0 | 0.1 | 0.2 | 0.3 | 0.6 | 0.4 |
| කම්බි ඇණ | 1.8 | 1.8 | 2.7 | 3.9 | 3.8 | 19.8 | 16.1 | 17.9 | 10.1 | 8.5 | 0.5 | 0.5 | 0.6 | 0.7 | 0.4 |
| අනෙකුත් | 1.1 | 0.7 | 1.9 | 17.5 | 19.5 | 12.1 | 6.3 | 12.6 | 45.5 | 43.6 | 0.3 | 0.2 | 0.4 | 3.3 | 2.3 |
| xv. විදුලි යන්ත්‍ර සූත්‍ර, උපකරණ මෙවලම් හා සැපයුම් | — | — | — | — | 14.0 | — | — | — | — | 100.0 | — | — | — | — | 1.7 |
| xvi. යකඩ කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොයදහන්) | 3.7 | 4.3 | 5.8 | 11.0 | 14.7 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 1.1 | 1.1 | 1.3 | 2.0 | 1.7 |
| ප්ලාස්ටික් | 2.0 | 2.5 | 3.1 | 5.8 | 8.8 | 54.1 | 58.1 | 53.4 | 52.7 | 59.9 | 0.6 | 0.6 | 0.7 | 1.1 | 1.0 |
| අනෙකුත් | 1.7 | 1.8 | 2.7 | 5.2 | 5.9 | 40.5 | 41.9 | 46.6 | 47.3 | 40.1 | 0.5 | 0.5 | 0.6 | 1.0 | 0.7 |
| xvii. පිඟන් බඩු | 1.1 | 1.9 | 2.5 | 2.4 | 2.4 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 0.3 | 0.5 | 0.6 | 0.4 | 0.3 |
| xviii. තුනී ලැලි | 2.9 | 3.4 | 3.9 | 3.9 | 5.2 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 0.9 | 0.9 | 0.9 | 0.7 | 0.6 |
| xix. ඛනිජ වැලි | 0.1 | 0.1 | 0.1 | 0.9 | 1.3 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | ... | ... | ... | 0.2 | 0.2 |
| xx. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය | 0.2 | 1.1 | 1.2 | 1.0 | 1.6 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 0.1 | 0.3 | 0.3 | 0.2 | 0.2 |
| xxi. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝ නිෂ්පාදිත | 17.9 | 20.2 | 22.5 | 23.0 | 36.5 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 5.4 | 5.2 | 5.2 | 4.3 | 4.3 |
| එකතුව | 331.7 | 388.0 | 432.4 | 537.5† | 847.0 | | | | | | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

* 1965 සංඛ්‍යාවන් II වැනි ගණය යටතේ දක්වා ඇත.

† සංශෝධිත සංඛ්‍යා.

කර්මාන්තයෙහි ව්‍යාප්තියෙන්, දේශීය කර්මාන්තයේ ව්‍යාප්තිය මෙන්ම ආනයන ආදේශනය කිරීම් වැඩිවීමෙක්ද පිළිබිඹු වෙයි. මේ අයුරින්ම, ලෝහ භාජන කර්මාන්තය ද වර්ෂය තුළදී සියයට 40 ට වැඩියෙන් ව්‍යාප්ත විය. 1963 දී රුපියල් කෝටි 0·21 ක්වූ නිමැවුම් වටිනාකම 1964 දී රුපියල් කෝටි 0·49 දක්වා ද, 1965 දී රුපියල් කෝටි 0·93 දක්වා ද වැඩිවිය. කම්බි ඇණ හා කටු කම්බි නිෂ්පාදනය රුපියල් කෝටි 0·39 සිට රුපියල් කෝටි 0·33 දක්වා පහළ වැටිණි. දේශීය කර්මාන්තය මෙරට පවත්නා ඉල්ලුමට සරිලන පමණට නිපදවීමට හැකි තත්ත්වයකට එළඹ ඇති බවත්, කර්මාන්තය තවදුරටත් ව්‍යාප්ත කළ හැකි වනුයේ වෙළෙඳ පොළෙහි ඉල්ලුම වැඩිවුවහොත් පමණක් බවත් එයින් පෙනී ගියේය. වැඩි වශයෙන්ම අවසාන පාරිභෝගික නිෂ්පාදිත වශයෙන් මහජනයා අතට පත්වන, ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය ද වර්ෂය තුළදී සැලකිය යුතු ලෙස ව්‍යාප්ත වී ඇති අතර නිෂ්පාදන වටිනාකම 1964 සංඛ්‍යාව වූ රුපියල් කෝටි 0·58 සිට 1965 දී රුපියල් කෝටි 0·88 දක්වා වැඩිවී ඇත. මෙකී 1965 සංඛ්‍යාව 1963 නිමැවුම් වටිනාකම මෙන් තෙගුණයකට ආසන්න වෙයි.

**මුළු නිමැවුමට ඇතුලත් කර්මාන්තයන්හි සාපේක්ෂ කොටස්**

ප්‍රධාන කාර්මික ගණයන් තුළ වූ කර්මාන්තයන්හි සාපේක්ෂ තත්ත්වය අනුව නිමැවුම් වටිනාකමෙහි වෙනස්වීම් II (ආ) අ. 2 සංඛ්‍යා සටහනේ දෙවැනි කාණ්ඩයෙහි දක්වෙයි. කල් තබාගන්නා ලද හා ටින්වල අහුරන ලද පළතුරු, එළවළු, මස්, මාළු හා මුහුදෙන් ගන්නා වෙනත් ආහාර වර්ග ගණයෙහි, ජෑම්, ජෙලි හා සෝසස් නිමැවුම මුළු නිමැවුමෙන් සියයට 63 ක් වූ අතර අනෙක් නිෂ්පාදිත ප්‍රමාණය සියයට 37 ක් විය.

ගොතන ලද ඇඳුම් පැලඳුම් හා මසන ලද ඇඳුම් ගණයෙහි මුළු නිෂ්පාදනයෙන් සියයට 54·6 ක් කමිස වූ අතර, 1965 දී මෙම ගණයේ අනෙකුත් නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්ම බැනියන්) ප්‍රමාණය සියයට 45·4 ක් වූයේය. 1965 දී විවිධ රසායනික නිෂ්පාදිත ගණයේ මුළු නිමැවුමෙන් සියයට 10·4 ක් ඖෂධ වර්ග විය. 1965 දී කඩදසි හා කඩදසි නිෂ්පාදිත මුළු නිමැවුමෙන් සියයට 35·5 ක් ලියන කඩදසි වූ (අභ්‍යාස පොත් ආදිය ඇතුළු) අතර සියයට 20·1 ක් කාටන් හා අහුරන පෙට්ටි ද, සියයට 11·6 ක් ඔතන කඩදසි ද විය. 1965 දී ලෝහ නිෂ්පාදිත ගණයෙහි මුළු නිමැවුමෙන් සියයට 20·1 ක් ඇලුමිනියම් භාණ්ඩ වූ අතර සියයට 20·8 ක් ලෝහ භාජන වූයේය.

මුළු කාර්මික නිමැවුමෙහි ඇතුලත් ඒ ඒ වර්ගවල කර්මාන්තවල කොටස II (ආ) අ. 2 සංඛ්‍යා සටහනෙහි තෙවැනි තීරු කාණ්ඩයෙහි දක්වෙයි. විවිධ කාර්මික ගණයන් අතුරෙන් එළවළු තෙල් හා මේද කර්මාන්තයේ නිමැවුම මුළු කාර්මික නිමැවුමෙන් සියයට 22·5 ක් විය. මුළු කාර්මික නිමැවුමෙන් සියයට 12·8 ක් විවිධ ආහාර නිෂ්පාදිත වලින් සියයට 10·8 ක් නූල් කැටීම්, රෙදිපිළි විවීම් හා නිමා කිරීම් වලින් ද, සියයට 6·6 ක් ගෙතූ ඇඳුම් හා මසන ලද ඇඳුම් වලින් ද, සියයට 10·8 ක් විවිධ රසායනික නිෂ්පාදිත වලින්ද. සියයට 3·4 ක් කඩදසි හා කඩදසි බෝඩ්වලින් තැනූ භාණ්ඩවලින්ද, සියයට 5·3 ක් ලෝහ, නිෂ්පාදිත වලින්ද සමන්විත විය. මෙහිදී ද, සමීක්ෂණ විෂය පථය පුලුල් වීම හේතුකොටගෙන 1965 දී කර්මාන්ත අතර සාපේක්ෂ වැදගත්කමෙහි ඇතිවී තිබෙන වෙනස්කම් නිවැරදි ලෙස මැනීම දුෂ්කරවී ඇත. එසේ වුවද, සමහර අලුත් කර්මාන්ත ඇතුලත් කිරීමෙන් පසුව, මුළු නිමැවුමෙහි ඇතුලත් ප්‍රධාන කාර්මික ගණයන්ගේ සාපේක්ෂ කොටස් වර්තමාන දර්ශකයන්ගෙන් පෙනීයයි.

## සංඛ්‍යා සටහන II (ආ) අ. 3

## 1961 - 65 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම - ප්‍රධාන ආර්ථික ගණ අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1961 | 1962 | 1963 | 1964 | 1965 |
| **අ. පාරිභෝගික භාණ්ඩ** .. | **186·6** | **236·1** | **275·1** | **340·1** | **456·9** | **56·3** | **60·8** | **63·7** | **63·3** | **53·9** |
| ආහාර පාන හා දුම්කොළ .. | 94·8 | 105·0 | 119·1 | 133·0 | 143·9 | 28·6 | 27·1 | 27·6 | 24·8 | 17·0 |
| විවිධ ආහාර නිෂ්පාදන (1) .. | 35·8 | 33·6 | 34·1 | 36·0 | 28·0 | 10·8 | 8·7 | 7·9 | 6·7 | 3·4 |
| කල්තබාගත් හා ටින්වල අසුරන ලද පළතුරු, එළවළු, මස්, මාළු සහ මුහුදින් ලැබෙන අනෙකුත් ආහාර2 | 1·6 | 2·3 | 3·4 | 3·8† | 5·4 | 0·5 | 0·6 | 0·8 | 0·8† | 0·6 |
| විස්කෝතු හා රසකැවිලි .. | 18·2 | 21·9 | 28·8 | 30·9 | 34·9 | 5·5 | 5·6 | 6·7 | 5·7 | 4·1 |
| සිසිල් බීම .. | 7·8 | 10·0 | 11·4 | 13·4 | 16·0 | 2·4 | 2·6 | 2·6 | 2·5 | 1·9 |
| බීර සහ ස්ටවුට් .. | 2·4 | 2·2 | 2·4 | 2·7 | 7·6 | 0·7 | 0·6 | 0·6 | 0·5 | 0·9 |
| දුම්කොළ .. | 29·0 | 35·0 | 39·0 | 46·2 | 52·0 | 8·7 | 9·0 | 9·0 | 8·6 | 6·1 |
| ඇඳුම් (3) .. | 19·8 | 29·3 | 38·4 | 54·9 | 55·5 | 6·0 | 7·5 | 8·9 | 10·2 | 6·5 |
| පාවහන් හා හම් නිෂ්පාදිත .. | 8·5 | 19·6 | 22·3 | 23·4 | 24·7 | 2·6 | 5·0 | 5·2 | 4·3 | 2·9 |
| විවිධ රසායනික නිෂ්පාදිත (4) .. | 40·3 | 51·5 | 56·0 | 73·7 | 91·2 | 12·1 | 13·3 | 13·0 | 13·7 | 10·8 |
| කඩදාසි, කඩදාසි උපකරණ හා කඩදාසි බෝඩ් (5) .. | 7·0 | 10·0 | 12·2 | 19·2 | 16·2 | 2·1 | 2·6 | 2·8 | 3·6 | 1·9 |
| ලෝහ නිෂ්පාදිත (6) .. | 4·5 | 5·3 | 7·3 | 9·2 | 9·0 | 1·4 | 1·4 | 1·7 | 1·7 | 1·0 |
| සකස් කළ නිෂ්පාදිත (වෙන තැනක නොසඳහන්) (7) .. | 3·7 | 4·3 | 5·8 | 11·0 | 14·7 | 1·1 | 1·1 | 1·3 | 2·0 | 1·7 |
| පිඟන් බඩු .. | 1·1 | 1·9 | 2·5 | 2·4 | 2·4 | 0·3 | 0·5 | 0·6 | 0·4 | 0·3 |
| රබර් භාණ්ඩ (8) .. | 6·9 | 9·2 | 11·5 | 13·3 | 8·0 | 2·1 | 2·4 | 2·7 | 2·5 | 1·0 |
| නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිම කිරීම .. | — | — | — | — | 91·3 | — | — | — | — | 10·8 |
| **ආ. අන්තර් භාණ්ඩ** .. | **122·7** | **126·9** | **126·8** | **146·3** | **316·1** | **37·0** | **32·7** | **29·3** | **27·2** | **37·3** |
| විවිධ ආහාර නිෂ්පාදන (9) .. | 111·1 | 114·2 | 113·5 | 124·7 | 271·6 | 33·5 | 29·4 | 26·2 | 23·2 | 32·1 |
| ලෝහ නිෂ්පාදිත (10) .. | 1·5 | 2·7 | 2·1 | 4·9 | 9·3 | 0·4 | 0·7 | 0·5 | 0·9 | 1·1 |
| කඩදාසි, කඩදාසි උපකරණ හා බෝඩ (11) .. | 6·9 | 5·4 | 6·0 | 10·9 | 13·1 | 2·1 | 1·4 | 1·4 | 2·0 | 1·5 |
| තුනී ලෑලි .. | 2·9 | 3·4 | 3·9 | 3·9 | 5·2 | 0·9 | 0·9 | 0·9 | 0·7 | 0·6 |
| ඛනිජ වැලි .. | 0·1 | 0·1 | 0·1 | 0·9 | 1·3 | ... | ... | ... | 0·2 | 0·2 |
| මූලික කාර්මික රසායන ද්‍රව්‍ය (12) | 0·2 | 1·1 | 1·2 | 1·0 | 1·6 | 0·1 | 0·3 | 0·3 | 0·2 | 0·2 |
| විදුලි භාණ්ඩ .. | — | — | — | — | 14·0 | — | — | — | — | 1·6 |
| **ඇ. ආයෝජන භාණ්ඩ** .. | **22·4** | **25·1** | **30·4** | **51·1** | **74·0** | **6·7** | **6·5** | **7·0** | **9·5** | **8·7** |
| ලෝහ නිෂ්පාදිත (13) .. | 3·1 | 3·2 | 5·7 | 24·4 | 26·4 | 0·9 | 0·8 | 1·3 | 4·5 | 3·1 |
| රබර් නිෂ්පාදිත (14) .. | 1·4 | 1·7 | 2·2 | 3·7 | 11·1 | 0·4 | 0·4 | 0·5 | 0·7 | 1·3 |
| සිමෙන්ති හා සිමෙන්ති නිෂ්පාදිත ඇස්බැස්ටෝ නිෂ්පාදිත .. | 17·9 | 20·2 | 22·5 | 23·0 | 36·5 | 5·4 | 5·2 | 5·2 | 4·3 | 4·3 |
| **එකතුව** .. | **331·7** | **388·0** | **432·0** | **537·5†** | **847·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුව

සංලක්ෂ්‍යය:–

1. කිරි නිෂ්පාදිත අයිස් ක්‍රීම් සහ ලුනු.
2. ජෑම්, ජෙලි, සෝස්, පළතුරු කෝඩියල් යනාදිය.
3. කමිස සහ බැනියන් යනාදිය.
4. ඖෂධ, විලේපන, සබන් හා පවිත්‍ර කිරීමේ සංයෝග, ගිණි පෙට්ටි, දන්තාලේප යනාදිය.
5. ලියන කඩදාසි, අභ්‍යාස පොත් යනාදිය.
6. ඇලුමිනියම් භාණ්ඩ.
7. ප්ලාස්ටික් භාණ්ඩ යනාදිය.
8. සයිකල් ටයර් හා ටියුබ්, සෙල්ලම් බඩු හා ගෘහෝපකරණ.
9. ගව හා කුකුල් කෑම, තෙල් හා මේද, අයිස්, කපාපු පොල් යනාදිය.
10. භාජන.
11. මුද්‍රණ කඩදාසි, කාට්න් හා අනෙකුත් අහුරන පෙට්ටි හා ඔතන කඩදාසි.
12. කෝස්ටික් සෝඩා සහ ක්ලෝරයින්.
13. කටුකම්බි, කම්බි ඇණ, ගැල්වනයිස් නිෂ්පාදිත යනාදිය.
14. ටයර් නැවත පිරවීම.

† සංශෝධිත සංඛ්‍යාව.

කාර්මික නිෂ්පාදනයෙන් විශාල සමානුපාතයක් (1964 දී සියයට 63·3 ක් ද, 1965 සියයට 53·9 ක් ද) පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනයෙහි යෙදී ඇති බැව් ප්‍රධාන කාර්මික ගණයන්හි මුළු නිමැවුමේ (සංඛ්‍යා සටහන II (ආ) අ. 3) සාපේක්ෂ කොටස් වලින් පෙනී යයි. කඩදාසි හා කඩදාසි බෝඩ්, තුනී ලෑලි හා ලෝහ නිෂ්පාදිත වැනි අන්තර් භාණ්ඩ නිපදවන කර්මාන්ත සංඛ්‍යාව 1964 සංඛ්‍යාවවූ සියයට 27·2 සිට 1965 දී සියයට 37·3 දක්වා සාපේක්ෂ වශයෙන් වැඩිවී ඇත. සමහර වර්ගවල ලෝහ හා රබර් නිෂ්පාදිත හා සිමෙන්ති හා ඇස්බැස්ටෝ නිෂ්පාදිත වැනි ආයෝජන භාණ්ඩ නිපදවන කර්මාන්තවල සමානුපාතිකය ඉතා සුළු විය. 1964 දී එය මුළු කාර්මික නිෂ්පාදනයෙන් සියයට 9·5 ක් වූ අතර 1965 දී එම අනුපාතිය සියයට 8·7 දක්වා පහළ වැටුනේය. මෙයට හේතුවූයේ අන්තර් භාණ්ඩ නිපදවන කර්මාන්ත තියුණු ලෙස ව්‍යාප්තවීමත් සමගම, මුළු නිමැවුමට ඇතුලත් පාරිභෝගික හා ආයෝජන භාණ්ඩවල සාපේක්ෂ සමානුපාතය අඩුවීමේ ප්‍රවණතාවයක් ඇතිවීමය. කොටින්ම, ආයෝජන හෝ ප්‍රාග්ධන භාණ්ඩ කර්මාන්තයක් මෙරටෙහි ඇත්තේම නැතැයි කිවහැකිය. යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය, තේ රබර් යන්ත්‍ර සූත්‍ර හා පොම්ප, හා මෝටර් වැනි විදුලි උපකරණ වර්ග සමහරක් නිපදවන ව්‍යාපාරික ආයතන කිහිපයකට සීමාවී ඇත.

**කාර්මික ඒකකයක ප්‍රමාණත්වය**

කාර්මික ව්‍යාපාරික ආයතනයේ නිපැයුම් වටිනාකම් අනුව ප්‍රමාණත්වය බෙදී ගොස් ඇති අයුරු II (ආ) අ. 4 සංඛ්‍යා සටහනේ දක්වා ඇත. නිමැවුම් වටිනාකම අනුව, ව්‍යාපාරික ආයතන බෙදී ගිය අයුරු මේ අවුරුද්දේ සවිස්තරව වර්ග කොට ඇතිනිසා 1964 වර්ෂයේ වර්ග කිරීම එතරම් වැඩදායක නොවිය හැකිය. එහෙත් එක්තරා සංසන්දනයක් ප්‍රයෝජනවත් විය හැකිය. හැම අංශයකින්ම වාර්තා එවන ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව වැඩි වී ඇත. නිෂ්පාදන ව්‍යාපාරායතනයක ප්‍රමාණත්වය මැනීමෙහිලා එහි නිපැයුම, වේතන බිලට වඩා විශ්වාසදායක දර්ශක යක් වන්නේය. එහෙත් මෙහි සංඛ්‍යා සටහන් දෙක සැසැඳීමේ දී වැටුප් බිලෙහි හා නිපැයුම අතරත් කර්මාන්තයේ ප්‍රමාණත්වය අතරත්, පුළුල් වශයෙන් එක්තරා සම්බන්ධතාවයක් තිබෙන බව පෙනේ.

මුළු ව්‍යාපාරික ආයතන 782 න් 540 හෙවත් සියයට 69 ක් ම වාර්ෂික නිපැයුම් වටිනාකම රු. 2,50,000 අඩු ගණයට වැටේ. මෙහි ඒකාබද්ධ නිපැයුම මුළු නිපැයු මෙන් සියයට 8 ක් වෙයි. වාර්ත එවන ව්‍යාපාරික ආයතන අඩුව පැවැති පසුගිය වසරේ මේ සංඛ්‍යාව 463 ක් වූ අතර, මුළු නිපැයුමෙන් සියයට ගණන 8·7 කින් පමණ අඩුවී තිබෙන බව පෙනේ. නිපැයුම් වටිනාකම රු. 2,50,000 ක් හා රුපියල් විසිලක්ෂය අතර වූ වාර්තා එවන ව්‍යාපාරිකායතන සංඛ්‍යාව 1964 දී 155 ක් වූ අතර 1965 දී 188 දක්වා වැඩි විය. එහෙත් මේ ගණයේ නිපැයුම් මුළු නිපැයුමේ සියයට ගණනක් වශයෙන් ගෙන බලන විට, 1964 දී සියයට 28·4 ක් වූ අතර, 1965 දී සියයට 26 ක් විය. 1964 දී වර්ෂයට රුපියල් ලක්ෂ 20 ට වැඩි නිපැයුමක් ඇති ව්‍යාපාර ආයතන 37 ක් විය. මේ ආයතන වල නිපැයුම මුළු නිපැයුමෙන් සියයට 62·9 ක් විය. 1965 මේ ආයතන සංඛ්‍යාව, 54 ක් වූ අතර, එහි නිපැයුම මුළු නිපැයු මෙන් සියයට 66 ක් වීය.

එක් එක් කර්මාන්ත ගණයන් තුළ නිපැයුමෙහි සැලකිය යුතු සමානුපාතිකයක් පාලනය කරන ව්‍යාපාරික ආයතනයක් හෝ සමහර විට දෙකක් හෝ තිබෙන්නට පිළිවන. කල්තබා ගැනීම සඳහා පිළියෙල කැරුන හා ටින් වල අසුරන ලද පලතුරු හා එළවළු කර්මාන්තයෙහි නිපැයුමෙන් සියයට 45 ක් ම අයත් වන්නේ එක් ව්‍යාපාරික ආයතනයකටය. කඩදාසි නිෂ්පාදනයෙහි සැපයුමෙන් සියයට 42 ක් ම පාලනය කරනුයේ ව්‍යාපාරික ආයතන 2 ක් මගිනි. විදුලි උපකරණ

## සංඛ්‍යා සටහන II (ආ) අ. 4
## නිෂ්පාදන සමාගම් විශාලත්වය අනුව බෙදීගිය අයුරු - 1965
## නිෂ්පාදන වටිනාකම පදනම් කොට ඇත.

| කාර්මික ගණය | | නිපැයුම් වටිනාකම | | | |
|---|---|---|---|---|---|
| | | රු. < 250 දහස් | රු. 250 දහස් > 2 දශ ලක්ෂ | රු. > 2 දශ ලක්ෂ හා ඊට වැඩි | එකතුව |
| I. විවිධ ආහාර නිෂ්පාදන .. .. | සමාගම් ගණන | | | | |
| | නිපැයුමේ % | | ලැබී නොමැත | | |
| II. එලවළු තෙල් සහ මේද .. .. | සමාගම් ගණන | | | | |
| | නිපැයුමේ % | | ලැබී නොමැත | | |
| III. කල්තබාගත් හා ටින්වල අහුරන ලද එලවළු, මස්, මාළු සහ මුහුදෙන් ලැබෙන අනෙකුත් ආහාර .. .. | සමාගම් ගණන | 29 | 3 | 1 | 33 |
| | නිපැයුමේ % | 35 | 20 | 45 | 100 |
| IV. විස්කෝතු සහ කොකෝවා, චොකලට් සහ රස කැවිලි .. .. | සමාගම් ගණන | 42 | 18 | 5 | 65 |
| | නිපැයුමේ % | 10 | 35 | 55 | 100 |
| V. සිසිල් බීම සහ අංගාරික ජලය .. | සමාගම් ගණන | 22 | 2 | 5 | 29 |
| | නිපැයුමේ % | 8 | 16 | 76 | 100 |
| VI. බීර සහ ස්ටවුට් .. .. | සමාගම් ගණන | | | 1 | 1 |
| | නිපැයුමේ % | — | — | 100 | 100 |
| VII. දුම්කොළ .. .. | සමාගම් ගණන | | | | |
| | නිපැයුමේ % | | ලැබී නොමැත | | |
| VIII. ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. .. | සමාගම් ගණන | 76 | 28 | 6 | 110 |
| | නිපැයුමේ % | 11 | 35 | 54 | 100 |
| IX. නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිමා කිරීම .. .. | සමාගම් ගණන | 44 | 15 | 7 | 66 |
| | නිපැයුමේ % | 3 | 10 | 87 | 100 |
| X. පාවහන් හා හම් නිෂ්පාදිත .. | සමාගම් ගණන | 44 | 5 | 3 | 52 |
| | නිපැයුමේ % | 12 | 10 | 78 | 100 |
| XI. රබර් නිෂ්පාදන (පාවහන් හැර) .. | සමාගම් ගණන | 12 | 12 | 3 | 27 |
| | නිපැයුමේ % | 6 | 26 | 68 | 100 |
| XII. විවිධ රසායනික නිෂ්පාදිත .. | සමාගම් ගණන | 90 | 25 | 8 | 123 |
| | නිපැයුමේ % | 7 | 19 | 74 | 100 |
| XIII. කඩදාසි, කඩදාසි භාණ්ඩ හා කඩදාසි බෝඩ් .. | සමාගම් ගණන | 39 | 19 | 2 | 60 |
| | නිපැයුමේ % | 12 | 46 | 42 | 100 |
| XIV. ලෝහ නිෂ්පාදිත .. .. | සමාගම් ගණන | 62 | 29 | 7 | 98 |
| | නිපැයුමේ % | 10 | 42 | 48 | 100 |
| XV. විදුලි යන්ත්‍ර සූත්‍ර, උපකරණ මෙවලම් හා සැපයුම් .. .. | සමාගම් ගණන | 12 | 13 | 1 | 26 |
| | නිපැයුමේ % | 6 | 68 | 26 | 100 |
| XVI. සකස් කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන්) .. | සමාගම් ගණන | 60 | 15 | | 75 |
| | නිපැයුමේ % | 33 | 67 | — | 100 |
| XVII. පිහන් බඩු .. .. | සමාගම් ගණන | | | 1 | 1 |
| | නිපැයුමේ % | — | — | 100 | 100 |
| XVIII. තුනී ලෑලි .. .. | සමාගම් ගණන | | | 1 | 1 |
| | නිපැයුමේ % | — | — | 100 | 100 |
| XIX. ඛනිජ වැලි .. .. | සමාගම් ගණන | | 1 | | 1 |
| | නිපැයුමේ % | — | 100 | — | 100 |
| XX. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය .. | සමාගම් ගණන | | 1 | | 1 |
| | නිපැයුමේ % | — | 100 | — | 100 |
| XXI. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත හා ඇස්බැස්ටෝ නිෂ්පාදිත .. .. | සමාගම් ගණන | 8 | 2 | 3 | 13 |
| | නිපැයුමේ % | 1 | 8 | 90 | 100 |
| එකතුව .. | සමාගම් ගණන | 540 | 188 | 54 | 782 |
| | නිපැයුමේ % | 8 | 26 | 66 | 100 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන II (ආ) අ. 5

## නිෂ්පාදන සමාගම් විශාලත්වය අනුව බෙදීගිය අයුරු – 1965

## වැටුප් ලැයිස්තු පදනම් කොට

| කාර්මික ගණය | | රු. < 15 දහස් | රු. 15 දහස් < 50 දහස් | රු. 50 දහස් < 500 දහස් | රු. 500 දහස් හා වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| I. විවිධ ආහාර නිෂ්පාදනය .. | සමාගම් ගණන | | | ලැබී නොමැත | | |
| | වැටුපේ % | | | | | |
| II. එළවලු තෙල් හා මේද .. | සමාගම් ගණන | | | ලැබී නොමැත | | |
| | වැටුපේ % | | | | | |
| III. කල් තබාගත් හා ටින් වල අහුරන ලද පලතුරු, එළවළු මස්, මාළු සහ මුහුදින් ලැබෙන අනෙකුත් ආහාර .. | සමාගම් ගණන | 23 | 9 | 1 | | 33 |
| | වැටුපේ % | 16 | 49 | 35 | — | 100 |
| IV. විස්කෝතු සහ කොකෝවා චොකලට් සහ රසකැවිලි .. | සමාගම් ගණන | 31 | 22 | 11 | 1 | 65 |
| | වැටුපේ % | 6 | 22 | 37 | 35 | 100 |
| V. සිසිල් බීම, සහ අංගාරික ජලය .. | සමාගම් ගණන | 18 | 4 | 6 | 1 | 29 |
| | වැටුපේ % | 3 | 3 | 35 | 59 | 100 |
| VI. බීර සහ ස්ටවුට් .. .. | සමාගම් ගණන | — | — | — | 1 | 1 |
| | වැටුපේ % | | | | 100 | 100 |
| VII. දුම්කොළ .. .. .. | සමාගම් ගණන | | | ලැබී නොමැත | | |
| | වැටුපේ % | | | | | |
| VIII. ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. | සමාගම් ගණන | 48 | 34 | 25 | 3 | 110 |
| | වැටුපේ % | 5 | 13 | 46 | 36 | 100 |
| IX නූල් කැටීම, රෙදිපිළි විවීම හා නිමා කිරීම .. .. | සමාගම් ගණන | 31 | 19 | 13 | 3 | 66 |
| | වැටුපේ % | 2 | 6 | 19 | 73 | 100 |
| X. පාවහන් හා හම් නිෂ්පාදිත .. | සමාගම් ගණන | 34 | 10 | 6 | 2 | 52 |
| | වැටුපේ % | 5 | 6 | 19 | 70 | 100 |
| XI. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) .. | සමාගම් ගණන | 7 | 8 | 12 | — | 27 |
| | වැටුපේ % | 1 | 10 | 89 | | 100 |
| XII. විවිධ රසායනික නිෂ්පාදිත .. | සමාගම් ගණන | 61 | 38 | 21 | 3 | 123 |
| | වැටුපේ % | 4 | 9 | 35 | 52 | 100 |
| XIII. කඩදාසි, කඩදාසි භාණ්ඩ සහ කඩදාසි බෝඩ් .. | සමාගම් ගණන | 25 | 26 | 7 | 2 | 60 |
| | වැටුපේ % | 5 | 19 | 20 | 56 | 100 |
| XIV. ලෝහ නිෂ්පාදිත .. .. | සමාගම් ගණන | 30 | 36 | 32 | — | 98 |
| | වැටුපේ % | 3 | 18 | 79 | | 100 |
| XV. විදුලි යන්ත්‍ර සූත්‍ර උපකරණ, මෙවලම් හා සැපයුම් .. .. | සමාගම් ගණන | 8 | 8 | 10 | — | 26 |
| | වැටුපේ % | 3 | 13 | 84 | | 100 |
| XVI. සකස් කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන්) .. | සමාගම් ගණන | 38 | 32 | 5 | — | 75 |
| | වැටුපේ % | 14 | 55 | 31 | | 100 |
| XVII. පිඟන් බඩු .. .. | සමාගම් ගණන | — | — | — | 1 | 1 |
| | වැටුපේ % | | | | 100 | 100 |
| XVIII. තුනී ලෑලි .. .. | සමාගම් ගණන | — | — | — | 1 | 1 |
| | වැටුපේ % | | | | 100 | 100 |
| XIX. ඛනිජ වැලි .. .. | සමාගම් ගණන | — | — | 1 | — | 1 |
| | වැටුපේ % | | | 100 | | 100 |
| XX මූලික කාර්මික රසායන ද්‍රව්‍ය .. | සමාගම් ග ණන | — | — | — | 1 | 1 |
| | වැටුමප් % | | | | 100 | 100 |
| XXI. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බෙස්ටෝනිෂ්පාදිත .. | සමාගම් ගණන | 4 | 4 | 3 | 2 | 13 |
| | වැටුපේ % | 1 | 2 | 14 | 83 | 100 |
| එකතුව | සමාගම් ගණන | 358 | 250 | 153 | 21 | 782 |
| | වැටුපේ % | 4 | 12 | 37 | 47 | 100 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුව

කර්මාන්තයෙහි නිපැයුමෙන් සියයට 26 ක් ම අයත් වනුයේ එක් ව්‍යාපාරික ආයතනයකටය. පාවහන් හා හම් නිෂ්පාදන වල නිපැයුමෙන් සියයට 78 ක් සැපැයෙනුයේ ප්‍රධාන ව්‍යාපාරික ආයතන තුනකිනි. එමෙන් ම රබර් නිෂ්පාදනය යෙහි, නිපැයුමෙන් සියයට 68 සැපයෙනුයේ ව්‍යාපාරික ආයතන තුනක් මගිනි අනෙක් අතින් නිපැයුම රුපියල් 2,50,000 කට වඩා අඩු යැයි ප්‍රමාණ කැරුන ඉතා කුඩා ව්‍යාපාරික ඒකකයන් විශාල ම සංඛ්‍යාව පහත දැක්වෙයි. ඇඳුම් කර්මාන්තයෙහි ව්‍යාපාරික ආයතන 76 ක් ද, විවිධ රසායනික නිෂ්පාදනයන්හි 90 ක් ද, ලෝහ නිෂ්පාදනයන්හි 62 ක් ද, වෙනත් තන්හි සඳහන් නොවූ නිෂ්පාදනයන්හි ව්‍යාපාරික ආයතන 60 ක් ද වෙයි. නිපැයුමෙහි වටිනාකම රුපියල් 2,50,000 හා රුපියල් ලක්ෂ 20 අතර වූ අන්තර් ගණයේ ලෝහ නිෂ්පාදන සහ ගොතන ලද ඇඳුම් පැළඳුම් ආදී කර්මාන්ත ගණයන්හි පමණක් ම එක් කර්මාන්ත යකට ව්‍යාපාර ආයතන 25 කටත් අධික සංඛ්‍යාවක් ඇත. අනෙකුත් කර්මාන්ත ගණයන් වැඩි සංඛ්‍යාවට ම ඇත්තේ ව්‍යාපාර ආයතන 25 කටත් අඩු සංඛ්‍යාවෙකි.

කාර්මික ව්‍යාපාරික ආයතන වල ප්‍රමාණත්වය සම්බන්ධයෙන් මෙම විශ්ලේෂනයෙන් ඉස්මතු වී පෙනෙන එක් පොදු ලක්ෂණයක් නම්, එක් කර්මාන්ත ගණයක, යටත් පිරිසෙයින් ප්‍රධාන ව්‍යාපාරික ආයතනයක් හෝ සමහර විට දෙකක් හෝ දේශීය වෙළෙඳ පොළේ ඉතා සැලකිය යුතු කොටසක් හිමිකර ගෙන ඇති බවය. එසේ ම තවත් සමහර ව්‍යාපාරික ආයතන විශාල සංඛ්‍යාවක් සිය වෙළෙඳුම සුළු වුවද, විශාල ඒකකයන් සමග සමාන්තරව පවත්වාගෙන යයි. තවද, කාර්මික ගණයන් වර්ග කිරීමේ දී මෙකී ගණයන්ට ඇතුළත් වන විවිධ කර්මාන්ත යන් වෙන් වශයෙන් හැඳින්වීමක් නො කැරෙයි. ඉහත සඳහන් ව්‍යාපාරික ආයතන බොහෝ විට එක නිෂ්පාදනයක් ම සාදන්නේ නැත. එනමුත්, විශේෂ නිෂ්පාදනයක විශේෂත්වයක් ලැබ ඒ නිපදවයි. දිනපතා විශාල ලෙසින් අලෙවි වන හෝ ඉතා කෙටි කාල සීමාවන් ඇතුලත අළුත් තොග ලබා ගැනීමට අවැසි වන ද්‍රව්‍ය හැරුන විට, ව්‍යාපාරික ආයතන කිහිපයකට සාරූප්‍ය හෝ සමාන නිෂ්පාදන සෑදීමට වෙළෙඳ පොළෙහි සීමිතකම් නිසා ඉඩක් සැලසී නැත.

කාර්මික ව්‍යාපාර ආයතන වල වේතන බිලේ ප්‍රමාණත්වය අනුව ඒ බෙදී ගිය අයුරු II (ආ) අ. 5 සංඛ්‍යා සටහනේ දක්වා ඇත. යටකී පරිදි, වේතන බිලෙහි ප්‍රමාණය, ව්‍යාපාරිකායතනයේ ප්‍රමාණය දක්වන නිවැරදි දර්ශකයක් නොවේ. ප්‍රාග්ධන අධික ලෙස යෙදවෙන කර්මාන්ත වල ශ්‍රමය වෙනුවට ප්‍රාග්ධනය ආදේශ කිරීම සැලකිය යුතු තරම් විශාල විය හැකි නිසා ශ්‍රමය සඳහා වන වියදම එතරම් විශාල විය නොහැකිය. වසරකට වේතන බිල රුපියල් 15,000 කට වඩා අඩු ගණයට කාර්මිකායතන විශාල සංඛ්‍යාවක් ඇතුළත් වී ඇත. එම ගණයට අයත් ව්‍යාපාරික ආයතන, ගොතන ලද ඇඳුම්, පැළඳුම් හා මසන ලද ඇඳුම් ගණයෙහි 48 ක්ද, පාවහන් හා සම් නිෂ්පාදනයන්හි 34 ක් ද, විවිධ රසායනික නිෂ්පාදනයන්හි 61 ක් ද වෙයි. මුළු වාර්ෂික වේතන බිල රුපියල් 15,000 වත්, රුපියල් 50,000 වත් අතර වූ ගණයෙහි, ගොතන ලද ඇඳුම් පැළඳුම් හා මසන ලද ඇඳුම් ගණයෙහි ව්‍යාපාරික ආයතන 34 ක් ද, විවිධ රසායනික නිෂ්පාදනයන්හි 38 ක් ද, ලෝහ නිෂ්පාදනයන්හි 36 ක් ද වෙයි.

වේතන බිලෙහි ප්‍රමාණය වැඩි වන විට මෙකී එක් එක් වර්ගයට අයත් ව්‍යාපාර සංඛ්‍යාව අඩු වන අතට හැරෙයි. වේතන බිල වසරකට රු. 5,00,000 ය ඉක්මවන කර්මාන්තයට අයත් ව්‍යාපාරික ආයතන ගණන සාපේක්ෂිත වශයෙන් කිහිපයකි. මුළු වේතන බිලෙන් සියයට 35 ක් විස්කෝතු හා රසකැවිලි ගණයේ ව්‍යාපාරික ආයතනයකට ද, සියයට 59 ක් සිසිල් බීම හා අංගාරක ජල ගණයේ ව්‍යාපාරික ආයතනයට ද, සියයට 70 ක් පාවහන් හා හම් නිෂ්පාදන ගණයේ ව්‍යාපාරික ආයතන 2 කට ද, සියයට 73 ක් නූල් කැටීම්, රෙදි වියීම හා නිමා කිරීම් ගණයේ ව්‍යාපාරික ආයතන 3 කට ද වෙන් විය.

**අමුද්‍රව්‍ය පාවිච්චිය**

නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපාරික ආයතන 1,381 ක් සංඛ්‍යා තොරතුරු සැපයූ අතර ව්‍යාපාරික ආයතන 1,076 කින් අමු ද්‍රව්‍ය පාවිච්චිය හා ඒවා ලද අයුරු පිළිබඳවද සංඛ්‍යා තොරතුරු ලැබිණි. පාවිච්චි කරණ ලද අමු ද්‍රව්‍ය ප්‍රමාණයන් දක්වා ඇති අතර ඒවා මෙරටින් හෝ පිට රටින් ලැබුනේද යන්න අනුව අමු ද්‍රව්‍ය වර්ග කොට ඇත. මෙම සංඛ්‍යා තොරතුරු II (ආ) අ. 6 සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි. වාර්තා එවන ලද ව්‍යාපාරික ආයතන විසින් පාවිච්චි කරන ලද අමු ද්‍රව්‍යවල මුළු වටිනාකම රුපියල් කෝටි 22.12 ක් විය. මෙයින් සියයට 57 ක් හෙවත් රුපියල් කෝටි 12.5 ක අමු ද්‍රව්‍ය ආනයනය කරන ලද ඒවා වූ අතර සියයට 43 ක් හෙවත් රුපියල් කෝටි 9.61 ක අමු ද්‍රව්‍ය මෙරටින්ම ලබාගෙන ඇත. නිෂපාදකයින් විසින් අමු ද්‍රව්‍ය නිවැරදි ලෙස වර්ග කිරීමට හැමවිටම උත්සාහ දරා නොමැති බව එක් එක් ව්‍යාපාරික ආයතන වලින් එවුන වාර්තා පරීක්ෂා කිරීමේදී පෙනී යයි. ආනයනය කරනලද අමු ද්‍රව්‍ය ප්‍රමාණය වශයෙන් දක්වන ලද සංඛ්‍යාව වූ රුපියල් කෝටි 12.5 හෙවත් සියයට 57 පාවිච්චියට ගත් ආනයනය කරනු ලැබූ අමු ද්‍රව්‍යවල නියම වටිනාකමට අඩුවූ ඇස්තමේන්තුවකි. ව්‍යාපාරික ආයතන බොහොමයක්ම, ඔවුන් විසින් දේශීය වෙළඳ පොළේ තොග වෙළඳුන්ගෙන් මිලට ගන්නා ලද ආනයනය කැරුන අමු ද්‍රව්‍ය, මෙරටින් ලබාගත් ඒවා ලෙස වර්ග කර ඇති අතර කෙලින්ම ආනයනය කරන ලද අමු ද්‍රව්‍ය පමණක් ආනයනය කැරුන අමු ද්‍රව්‍ය ලෙස වර්ග කර ඇත. මෙහි දැක්වෙන කාර්මික ගණයන් විසින් පාවිච්චි කරන ලද අමු ද්‍රව්‍ය වලින් සියයට 70-75 දක්වා වූ ප්‍රමාණයක් ආනයනය කරන ලද අමු ද්‍රව්‍ය වුයේ යැයි දළ වශයෙන් ඇස්තමේන්තු කළ හැකිය. මේ අනුව, වාර්තා එවන ලද ව්‍යාපාරික ආයතනවල පමණක් මුළු කාර්මික නිෂ්පාදනය සඳහා වැයවී ඇති විදේශීය විනිමය ප්‍රමාණය රුපියල් කෝටි 15.5 - 16.6 පමණ හෝ ඊට මදක් වැඩි හෝ වෙයි. මෙම සමීක්ෂණයට විෂය වි ඇත්තේ ව්‍යාපාරික ආයතන වලින් සියයට 75 පමණ බැවින් නියම සංඛ්‍යාව මීට වඩා ඉතා වැඩිවිය හැකිය.

විවිධ ආහාර නිෂ්පාදිත කාර්මික ගණයට ඇතුලත් ආනයනය කරන ලද අමු ද්‍රව්‍ය ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් සුළු වූයේ, පාවිච්චි කරන ලද විදේශීය අමු ද්‍රව්‍ය වල වටිනාකම සියයට 19 ක් විය. එමෙන්ම, දුම්කොළ කර්මාන්තයද බොහෝසෙසින්ම මෙරට දුම්කොළ වගාව මත රඳා පවතිනුයේ ආනයනය කරන ලද අමු ද්‍රව්‍ය ප්‍රමාණය සියයට 27 ක් පමණක් විය. කල්තබා ගන්නා ලද හා ටින්වල අහුරන ලද පලතුරු, එළවළු, මස්, මාළු හා මුහුදෙන් ලබාගන්නා අනෙකුත් ආහාර ගණයේ නිෂ්පාදිත වලට ඇතුලත් ආනයනය කැරුන අමු ද්‍රව්‍ය ප්‍රමාණය සියයට 23 ක් වූ අතර විවිධ රසායනික නිෂ්පාදිතවලට ඇතුලත් ආනයනය කැරුන අමු ද්‍රව්‍ය ප්‍රමාණය සියයට 47 ක් විය. පෞද්ගලික අංශයේ අනෙක් සියළුම කාර්මික ගණයන් සඳහා පාවිච්චි කරන ලද විදේශීය අමු ද්‍රව්‍ය ප්‍රමාණය, මුළු අමු ද්‍රව්‍ය වල වටිනාකමින් සියයට 50 ට වඩා සැලකිය යුතු පමණකින් අධික විය. ආනයනය කරන ලද අමු ද්‍රව්‍ය ඉතා අධික අනුපාතයක් ඇත්ලත් බීර හා ස්ටවුට් සඳහා සියයට 78 ක්ද, නූල් කැටීම හා රෙදිපිළි විවීම සඳහා සියයට 95 ක් ද, විදුලි යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සඳහා සියයට 79 ක්ද, අන් තැනෙක නොසඳහන් සැකැසූ නිෂපාදිත සඳහා සියයට 87 ක් ද විය.

මෙහි දක්වන ලද සංඛ්‍යා තොරතුරු අනුව අළුත් කර්මාන්ත වලින් වැඩි ගණනක් බොහෝ සෙයින්ම ආනයනය කරන ලද අමු ද්‍රව්‍ය මත රඳා පවත්නෝ ය යන නිගමනයට එළඹීම නොවැලැක්විය හැකිය. අළුත් කර්මාන්ත වලින් විශාල සංඛ්‍යාවක් බොහෝ සෙයින් ම ආනයනය කරන ලද අමු ද්‍රව්‍ය මත රඳා පවත්නා බැවි ව්‍යාපාරික ආයතන වලින් ලබුන පිළිතුරු වලින්ද තරමක් දුරට එළි වෙයි. සමහර

## සංඛ්‍යා සටහන II (ආ) අ 6.

## නිෂ්පාදනය හා අමුද්‍රව්‍ය

රුපියල් දහස් ගණනින්

| කාර්මික ගණය | ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව | නිශ්පාදනය | අමු ද්‍රව්‍ය: දේශීය | අමු ද්‍රව්‍ය: විදේශීය | අමු ද්‍රව්‍ය: එකතුව |
|---|---|---|---|---|---|
| I. විවිධ ආහාර නිෂ්පාදිත .. | 21 | 25,458 | (81) 15,780 | (19) 3,749 | (100) 19,529 |
| II. එළවළු තෙල් සහ මේද .. | | | ලැබී නොමැත | | |
| III. කල්තබාගත් හා ටින්වල අසුරන ලද එළවළු, මස්, මාළු හා මුහුදින් ලැබෙන අනෙකුත් ආහාර .. | 22 | 4,234 | (77) 1,864 | (23) 543 | (100) 2,407 |
| IV. විස්කෝතු සහ කොකෝවා චොකලට් සහ රස කැවිලි .. | 47 | 18,079 | (36) 3,459 | (64) 6,270 | (100) 9,729 |
| V. සිසිල් බීම හා අංගාරික ජලය .. | 23 | 15,392 | (38) 2,620 | (62) 4,205 | (100) 6,825 |
| VI. බීර සහ ස්ටවුට් .. | 1 | 7,585 | (22) 598 | (78) 2,106 | (100) 2,704 |
| VII. දුම්කොළ .. | 460 | 52,022 | (73) 22,628 | (27) 8,229 | (100) 30,857 |
| VIII. ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. | 88 | 39,001 | (26) 7,348 | (74) 21,318 | (100) 28,666 |
| IX. නූල් කැටීම, රෙදි පිළි විවීම සහ නිමා කිරීම .. | 56 | 40,397 | (5) 749 | (95) 14,460 | (100) 15,209 |
| X. පාවහන් සහ හම් නිෂ්පාදිත .. | 43 | 24,346 | (36) 2,960 | (64) 5,304 | (100) 8,264 |
| XI. රබර් නිශ්පාදිත (පාවහන් හැර) .. | 27 | 18,906 | (26) 3,560 | (74) 10,218 | (100) 13,778 |
| XII. විවිධ රසායනික නිෂ්පාදිත .. | 104 | 88,054 | (53) 24,504 | (47) 21,459 | (100) 45,963 |
| XIII. කඩදසි, භාණ්ඩ කඩදසි බෝඩ . | 39 | 13,140 | (30) 2,324 | (70) 5,431 | (100) 7,755 |
| XIV. ලෝහ නිෂ්පාදිත .. | 68 | 40,526 | (45) 1,670 | (55) 2,037 | (100) 3,707 |
| XV. විදුලි යන්ත්‍රසූත්‍ර, උපකරණ, මෙවලම් හා සැපයුම් .. | 19 | 12,008 | (21) 1,427 | (79) 5,383 | (100) 6,810 |
| XVI. සකස් කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන් | 45 | 7,786 | (13) 483 | (87) 3,336 | (100) 3,819 |
| XVII. පිහන් බඩු .. | 1 | 2,380 | (14) 86 | (86) 539 | (100) 625 |
| XVIII. තුනී ලෑලි .. | 1 | 5,176 | (85) 1,786 | (15) 306 | (100) 2,092 |
| XIX. ඛණිජ වැලි .. | 1 | 1,291 | (100) 180 | — | (100) 180 |
| XX. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය .. | | | ලැබී නොමැත | | |
| XXI. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝ නිෂ්පාදිත .. | 10 | 31,552 | (17) 2,077 | (83) 10,116 | (100) 12,243 |
| එකතුව .. | **1,076** | **447,333** | (43) **96,103** | (57) **125,059** | (100) **221,162** |

සංඛ්‍යා; ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

සංලක්ෂ්‍යය: වරහන් තුළ වූ සංඛ්‍යා වලින් සියයට ගණන් දක්වේ.

ව්‍යාපාරික ආයතන විසින් ඔවුන් 1963 දී හා/හෝ 1964 දී නිෂ්පාදනයෙහි යෙදී සිටි නමුදු 1965 දී අමු ද්‍රව්‍ය ආනයනය සඳහා විදේශීය විනිමය වෙන් කිරීමට නොදුන් බැවින් නිෂ්පාදනයෙහි යෙදීමට නොහැකි වූ බැව් ප්‍රකාශ කරන ලදී. නිෂ්පාදනය නතර කිරීම හෝ ආනයනය කරන ලද අමු ද්‍රව්‍ය නොමැතිවීමෙන් නිෂ්පාදනය ආරම්භ නොකිරීම හෝ හේතුකොට ගෙන හිස් වාර්තා එවූ ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 105 ක් හෙවත් වාර්තා එවන ලද මුළු ව්‍යාපාරික සංඛ්‍යාවෙන් සියයට 8 ක් වෙයි.

**කාර්මික ව්‍යාප්තිය හා රැකී රක්ෂා**

වාර්තා එවූ ව්‍යාපාරිකායතන ගණන 717 සිට 1,381 දක්වා වැඩිවීමත් සමගම සියලු කර්මාන්තවල නියුතු සේවකයන්ගේ ගණනද 34,222 සිට 56,835 දක්වා සියයට 66 කින් පමණ, වැඩි විය. මෙම කර්මාන්ත වලින් විශාලම වැඩිවීම ඇතිවූ කර්මාන්ත යන් ( මින් සමහරක වැඩිවීම්වලට විෂය පථය පුළුල් වීම හේතුවූවා විය හැකිය. ) පහත දක්වා ඇත.

සිසිල් බීම නිපදවීමේ ව්‍යාපාරිකායතන ගණන 33 සිට 29 දක්වා අඩුවූ අතර ඒවායේ නියුතු සේවක සංඛ්‍යාව 1,083 සිට 1,343 දක්වා වැඩිවිය. අනික් අතට විවිධ ආහාර නිෂ්පාදිත කර්මාන්තයන්හි නියුතු ව්‍යාපාරිකායතන සංඛ්‍යාව 62 සිට 96 දක්වාද සේවක සංඛ්‍යාව 1964 රේ 3,520 සිට 1965 දී 3,622 දක්වාද වැඩිවිය. දුම්කොළ කර්මාන්තයෙහි නියුතු ව්‍යාපාරිකායතන ගණන 23 සිට 460 දක්වා වැඩිවූ අතර සේවක සංඛ්‍යාව 4,214 සිට 8,235 දක්වා ඉතා අඩු අනුපාතයකින් වැඩිවිය. මෙයින් පෙනී යනුයේ සංඛ්‍යාවලට මෙම වර්ෂයේදී ඇතුලත් වූ අතිරේක ව්‍යාපාරිකායතන යන් සාපේක්ෂ වශයෙන් සුළු ඒකකයන් වූ බවයි. විවිධ රසායනික නිෂ්පාදිත කර්මාන්තයන්හි යෙදී සිටින ව්‍යාපාරිකායතන සංඛ්‍යාව 96 සිට 123 දක්වා ද සේවක සංඛ්‍යාව 3,306 සිට 4,946 දක්වා ද වැඩිවිය. රැකී රක්ෂා අතින් තවත් සැල කිය යුතු වැඩි දියුණුවක් ඇතිවූයේ සකස් කළ නිෂ්පාදන (වෙන තැනක නොස දහන්) කර්මාන්තයෙහිය. මෙහි යෙදී සිටි ව්‍යාපාරිකායතන ගණන 1964 රේ සංඛ්‍යාව වූ 69 සිට 1965 දී 75 දක්වා වැඩිවූ අතර සේවක සංඛ්‍යාව 1,058 සිට 1,742 දක්වා වැඩි විය. සමීක්ෂණයට භාජන වූ විවිධාංග අතුරින් රැකියා සඳහා වැඩිම ඉඩකඩ සැලසී තිබුණේ නූල් කැටීම, රෙදිවිවීම හා රෙදිපිළි නිමා කිරීමේ කර්මාන්තයෙහිය එහි සේවාවෙහි යෙදී සිටි අයගේ ගණන 9,650 ක් විය.

**නිෂ්පාදනය හා වැටුප්**

විවිධ ආහාර නිෂ්පාදිත, දුම්කොළ, ඇඳුම් ගෙතීම, ඇඳුම් මැසීම, විවිධ රසාය නික නිෂ්පාදිත හා නූල් කැටීම, රෙදි විවීම හා රෙදිපිළි නිමා කිරීමේ කර්මාන්ත යන්හි වැඩකල මිනිස් දවස් ගණන දළලක්ෂය ඉක්මවා ඇත.

වැඩකල මුළු මිනිස් දවස් ගණන හා වැටුප් වශයෙන් ගෙවූ ප්‍රමාණය අතර ඉතා කිට්ටු සම්බන්ධතාවක් තිබූ බවත් දක්නට ලැබේ. මෙකී ව්‍යවසායයන් බොහොම යක්ම දෛනික හෝ වැඩ කොටස් අනුව වැටුප් ගෙවීම මෙයට හේතුවූවා විය හැකිය. මේ අනුව, විවිධ ආහාර නිෂ්පාදිත ව්‍යාපාරිකායතනයන් රුපි. කෝටි 0.51 ක් ද දුම්කොළ ව්‍යාපාරිකායතනයන් රුපි: කෝටි 1.9 ක්ද, විවිධ රසායනික නිෂ්පා දිත ව්‍යාපාරිකායතනයන් රුපි. කෝටි 0.94 ක්ද ඛනිජ නිෂ්පාදිත ව්‍යාපාරිකයතන යන් රුපි. කෝටි 0.52 ක්ද, නූල් කැටීම, රෙදි විවීම හා රෙදිපිළි නිමා කිරීමේ ව්‍යාපා රිකායතනයන් රුපි. කෝටි 0.99 ක් ද යන විසින් වැටුප් ගෙවා ඇත. සේවක සංඛ්‍යාවට අදාලව අඩුම වැටුප් වියදම දරා ඇත්තේ නූල් කැටීම, විවීම හා රෙදිපිළි නිමා කිරීමේ කර්මාන්තයෙහිය. මෙම කර්මාන්තයෙහි නියුතු සේවක සංඛ්‍යාව 9,650 ක්වූ අතර ඔවුන් ලබා ඇති මුළු වැටුප් ප්‍රමාණය රුපියල් කෝටි 0·99 ක් විය.

මෙසේ වුවද, 4,946 දෙනෙක් සේවාවෙහි නියුතුව සිටින විවිධ රසායනික නිෂ්පාදිත කර්මාන්තයෙහි වැටුප් සඳහා ගිය වියදම රුපියල් කෝටි 0·94 ක් වූ අතර දුම්කොළ කර්මාන්තයෙහි නියුතු 8,235 දෙනෙකුට වැටුප් වශයෙන් රුපියල් කෝටි 1·9 ක් ගෙවා ඇත. එක් එක් කර්මාන්ත ගණයන් අතර, වැටුප් ප්‍රමාණයන්හී සැලකිය යුතු වෙනස්කම් ඇති බව මෙයින් පිළිබිඹු වෙයි. දුම්කොළ හා විවිධ රසායනික නිෂ්පාදිත කර්මාන්තයන්හි සේවක සංඛ්‍යාවන් අනුව බලන කල වැටුප් වියදම් වැඩිවී ඇත්තේ සේවකයන්ට ( වැඩි ඉපැයුම් සඳහා ඉඩ සලසමින් ) මාරුවෙන් මාරුවට වැඩ කළ හැකි පරිදි නිෂ්පාදන වැඩ පිළිවෙල දෛනික වැඩ මාරු ක්‍රමයක් අනුව සකසා තිබීමේ හේතුවෙනි.

සියළු කර්මාන්තයන් සමස්තයක් වශයෙන් ගත් කල, 1965 දී මිනිස් දවසක වැටුප රුපියල් 6.19 සිට රුපියල් 5.78 දක්වා පහළ වැටිණි. මෙයට බොහෝ දුරටම හේතු වූයේ වැදගත් කර්මාන්ත වර්ග කීපයකම මිනිස් දවසක වැටුප සාමාන්‍යයෙන් සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීමය. නිදසුන් වශයෙන් මිනිස් දවසක වැටුප විවිධ ආහාර නිෂ්පාදිත කර්මාන්තයන්හි රුපියල් 6 65 සිට රුපියල් 4.80 දක්වා ද රබර් නිෂ්පාදිත (පාවහන් හැර) කර්මාන්තයෙහි රුපියල් 5 21 සිට රු. 5.15 දක්වා ද පාවහන් හා හම් නිෂ්පාදිත කර්මාන්තයෙහි රු 8.30 සිට රු. 7.75 දක්වා ද අඩුවිය. අනිත් අතට වෙනත් කර්මාන්ත වර්ග කීපයකම තරමක් කැපී පෙනෙනසේ වැටුප් වැඩිවීම් ඇති විය. මෙහිලා සිසිල් බීම කර්මාන්තයෙහි මිනිස් දවසක වැටුප රු. 8 සිට රු. 8.64 දක්වා ද, බීර හා ස්ටවුට් නිෂ්පාදන කර්මාන්තයෙහි වැටුප රු. 5.50 සිට රු. 8.22 දක්වා ( මෙය සියයට 50 ක පමණ වැඩිවීමකි. ) වැඩිවීම නිදසුන් කොට දැක්විය හැකිය. පසුව සඳහන් කළ කර්මාන්තයෙහි මිනිස් දවසක වැටුප තියුණු ලෙස වැඩි වූයේ නිෂ්පාදනයෙහි ද සැලකිය යුතු දියුණුවක් ඇති කර ලමිනි. මෙකී කර්මාන්තයන් බොහොමයක ම වැටුප් ප්‍රමාණයන් තීරණය කරනු ලබන්නේ පඩි පාලක සභා හෝ අවම වැටුප් ප්‍රමාණයන් නියම කරන වෙනත් තන්ත්‍රයක් හෝ විසිනි. එබැවින් මිනිස් දවසක වැටුප අඩු වන්නට ඇත්තේ අවම වැටුප් මට්ටමෙහි නියම වශයෙන් ඇති වූ අඩුවීමක් නිසා නොව නිපැයුම් අඩුවීම හා ඒ හේතුවෙන් වර්ෂය තුළ වැඩ කරන දින ගණන අඩුවීමේ හේතුවෙන් විය යුතුය.

කර්මාන්ත වර්ග තුනක මිනිස් දවසක වැටුප අනිත් කර්මාන්ත.වලට වඩා සැලකිය යුතු ලෙස අඩු විය. මෙයින් අඩුම වැටුපක් ලබා ඇත්තේ නූල් කැටීම, රෙදි විවීම හා රෙදිපිළි නිමා කිරීමේ කර්මාන්තයේ සේවකයන්ය. එහි මිනිස් දවසක වැටුප රුපියල් 3.54 ක් වූයේ අවම වැටුප් නියම කිරීමේ ව්‍යාවස්ථාපිත තන්ත්‍රයක් නොතිබීමේ අඩුව පිළිබිඹු විය. විස්කෝතු හා කොකෝවා, චොකලට් හා රසකැවිලි කර්මාන්තවල දවසක වැටුප රු. 3.65 ක් වූ අතර, සකස් කළ නිෂ්පාදිත (වෙන තැනක නොසඳහන්) කර්මාන්තයන්හි දවසක වැටුප රු. 3.96 ක් විය. පසුව දැක්වූ කර්මාන්ත දෙකද අවම වැටුප් නීතියට යටත් නොවේ.

සේවකයකුට වැටෙන මිනිස් දවස් ගණන, කාර්මික අංශයේ කාර්ය නියුක්තිය බොහෝ දුරටම නිරවද්‍ය ලෙස පෙන්වන දර්ශකයක් වෙයි. 1965 දී සේවකයෙකුට වැටෙන මිනිස් දවස් ගණන 270 ක් විය. 1964 දී මෙය 271 ක් වූ අතර, 1963 දී 278 ක් විය. මෙහි අඩුවීම සුළු වුවද, එම අඩුවීමට තරමක් දුරට හේතු වූයේ වසරේ මුල් සමය තුළ අමු ද්‍රව්‍ය නොමැතිවීමෙන් ඇති වූ කාර්ය නියුක්තියෙහි පිරිහීමය. සාධක ආදේශනය හා ශ්‍රමය වෙනුවට යන්ත්‍රෝපකරණ යෙදවීම ද මෙම අඩුවීමට තරමක් දුරට හේතු වූවා විය හැකිය.

## සංඛ්‍යා සටහන II (ආ) අ. 7

## නිෂ්පාදනය සහ ඉන්ධන

රුපියල් දහස් ගණනින්

| කාර්මික ගණය | ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව | නිෂ්පාදනය | පාවිච්චිකළ ඉන්ධන | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | විදුලි බලය | ගල් අඟුරු හා ගෑස් | පැට්‍රෝල් සහ තෙල් | අනෙකුත් | එකතුව |
| I. විවිධ ආහාර නිෂ්පාදිත .. .. | 16 | 25,961 | 413 | 53 | 42 | — | 508 |
| II. එලවළු, තෙල් සහ මේද .. .. | ලැබී නොමැත | | | | | | |
| III. කල්තබාගත් සහ ටින්වල අසුරන ලද එළවළු, මස්, මාළු සහ මුහුදින් ලැබෙන අනෙකුත් ආහාර .. .. | 6 | 1,554 | 3 | 4 | 1 | — | 8 |
| IV. බිස්කෝතු සහ කොකෝවා, චොකලට් සහ රස කැවිලි .. .. | 21 | 11,354 | 88 | 100 | 23 | 22 | 233 |
| V. සිසිල් බීම සහ අංගාරික ජලය .. .. | 4 | 135 | .. | 3 | — | — | 3 |
| VI. බීර සහ ස්ටවුට් .. .. | 1 | 7,585 | 73 | — | 210 | — | 283 |
| VII දුම්කොළ .. .. | ලැබී නොමැත | | | | | | |
| VIII. ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. | 26 | 12,421 | 56 | 23 | 1 | — | 80 |
| IX. නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිම කිරීම .. .. | 18 | 32,119 | 265 | 676 | 26 | 1 | 968 |
| X. පාවහන් හා හම් නිෂ්පාදිත .. .. | 9 | 20,236 | 277 | 62 | 30 | .. | 369 |
| XI. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) .. .. | 13 | 7,450 | 117 | 84 | — | 171 | 372 |
| XII. විවිධ රසායනික නිෂ්පාදිත .. .. | 29 | 21,842 | 127 | 38 | .. | — | 165 |
| XIII. කඩදාසි, කඩදාසි බෝඩ කඩදාසි භාණ්ඩ .. | 15 | 12,900 | 419 | 446 | .. | — | 865 |
| XIV. ලෝහ නිෂ්පාදිත .. .. | 37 | 27,790 | 223 | 56 | 112 | .. | 391 |
| XV. විදුලි යන්ත්‍ර සූත්‍ර, උපකරණ, මෙවලම් හා සැපැයුම් .. .. | 10 | 9,268 | 322 | 34 | 99 | 69 | 524 |
| XVI. සකස් කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන්) .. .. | 11 | 1,823 | 20 | 13 | — | .. | 33 |
| XVII. පිහන් බඩු .. .. | ලැබී නොමැත | | | | | | |
| XVIII. තුනී ලෑලි .. .. | ලැබී නොමැත | | | | | | |
| XIX. ඛනිජ වැලි .. .. | ලැබී නොමැත | | | | | | |
| XX. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය .. .. | ලැබී නොමැත | | | | | | |
| XXI. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝ නිෂ්පාදිත .. .. | 5 | 17,038 | 160 | 10 | — | — | 170 |
| එකතුව .. | 221 | 209,476 | 2,563 | 1,602 | 544 | 263 | 4,972 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

**බලය හා ඉන්ධන**

මෙම සමීක්ෂණයෙන් ප්‍රධාන වශයෙන්ම අමු ද්‍රව්‍ය හා ශ්‍රමය ඇතුළත් නිෂ්පාදන සාධක උපයෝගී කර ගැණීම පිළිබඳ වූ සංඛ්‍යා තොරතුරු ඉදිරිපත් කරන ලදී. එහෙත් යෙදවූ බල හා ඉන්ධන මාර්ගයන් සහ ඒ සඳහා ගිය වියදම් විග්‍රහ කිරීමට ඉතිරිව ඇත. ව්‍යාපාරිකායතන බොහොමයක ම බලය උපයෝගී කර ගැණීම පිළිබඳව වාර්තා එවා ඇත. එබැවින් ඒ පිළිබඳව වර්ග කොට ඇති සංඛ්‍යා තොරතුරු (II(ආ)(අ) 7 සංඛ්‍යා සටහන) අදාල වනුයේ ව්‍යාප රිකායතන 221 කට පමණි. නිෂ්පාදන කර්මාන්ත වැඩි වශයෙන් උපයෝගී කරගත් බලය විදුලි බලයයි. වාර්තා සපයා ඇති ව්‍යාපාරිකායතන උපයෝගී කර ගත් විදුලි බලයෙහි වටිනාකම රුපියල් කෝටි 0·25 ක් විය. මෙය මුළු නිෂ්පාදන වියදමෙන් සියයට 1·2 ක් හෝ උපයෝගී කරගත් ඉන්ධන වලින් සියයට 52 ක් වෙයි. ඉන්ධන වර්ගයක් වශයෙන් ඊලඟට වැදගත් වූයේ ගල් අඟුරු හා ගෑස්ය. උපයෝගී කර ගත් ඉන්ධන සියයට 32 කින් සමන්විත වන මේ සඳහා මුළු වශයෙන් රුපියල් කෝටි 0·16 ක් වැය විය. ඊලඟට ගැනෙන ඉන්ධන තෙල් හා පැට්‍රොල් සඳහා රුපියල් 5,44,000 ක් වැය කොට ඇත. ඉන්ධන වැඩි කොටසක්, විශේෂයෙන්ම ගෑස්, ඉන්ධන තෙල් හා පැට්‍රොල් වෙනුවෙන් වැය වී ඇත්තේ විදේශීය විනිමයයි. විදුලි බලය සම්බන්ධයෙන් වුවද, තාප බලය සැපයීම සඳහා අවශ්‍ය දේ වලින් විශාල කොටසක් ආනයන වන බැවින් නිපදවනු ලබන බලයෙන් සියයට 30 කට පමණ වැය වනුයේ විදේශීය විනිමයයි.

**මිල**

නිෂ්පාදනායතනයන් සමීක්ෂණය කැරෙන අවස්ථාවේදී පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිෂ්පාදිතයන් ගේ මිල ගණන් හා නිෂ්පාදන වියදම් පිළිබඳව සංඛ්‍යා තොරතුරු එක් රැස් නොකැරිණි. එහෙත් කර්මාන්ත අමාත්‍යාංශයේ සංවර්ධන අංශයට සපයා ඇති වාර්තා වලින් එකී වියදම් හා සිල්ලර මිල ගණන් පිළිබඳව තරමක අවබෝධයක් ඇති කර ගන්නා ලදී.

රජයේ සමායතන වල හා පෞද්ගලික අංශයේ කර්මාන්ත වල මිල ගණන් නියම කැරෙන අන්දම, කාර්මික සංවර්ධනයෙහි ලා සුපරීක්ෂාකාරීව සොයා බැලිය යුත්තකි. රජයේ සමායතන වල මිල ප්‍රතිපත්තීන් පිළිබඳව වාර්තා කිරීමට කමිටුවක් පත් කොට ඇත. මෙම සමීක්ෂණයට ඇතුළත් පෞද්ගලික අංශයේ කර්මාන්ත බොහොමයකට ම නොයෙකුත් පහසුකම් සලසා දී තිබිණි. මේවාට බදු සහනයන් මෙන්ම අමු ද්‍රව්‍ය ආනයන සඳහා පනවා තිබූ සහනදායක ආනයන අනුපාතිකයන් ද ඇතුළත් විය. කොටින් කියතොත්, නිදහස් කාර්මික ප්‍රදේශ වල පිහිටුවා ඇති කර්මාන්ත වලට සාමාන්‍යයෙන් ලැබෙන පිළිවෙළේ සහනයන් මෙම කර්මාන්තවලට ලැබී තිබිණි. එබැවින් මේවායේ නිෂ්පාදන වියදම් වලට බදු හා ආනයන බදු සැලකිය යුතු තරම් ඇතුළත් වන්නේ නොවේ.

නව කර්මාන්තායතන, බදු වලින් නිදහස්ව, තීරු ගාස්තු හා ආනයන සීමා කිරීම් මගින් විදෙස් තරඟයෙන් ආරක්ෂා වී ඇති බැවින් ඒවායේ නිෂ්පාදිත උසස් තත්ත්වයෙන් විය යුතු අතර, සාධාරණ මිලට ලංකාවේ පාරිභෝගිකයනට මිල දී ගැණීමට පිළිවන්කම තිබිය යුතුය.

# (ආ) රාජ්‍ය අංශය

නිෂ්පාදනය

1965 දී කාර්මික සමායතන 16 ක නිෂ්පාදනය පිළිබඳ සංඛ්‍යා තොරතුරු II (ආ) ආ I. සංඛ්‍යා සටහනින් දැක්වෙයි. මෙයින් සමායතන දෙකක් තවම නිෂ්පාදනය අරඹා නොමැති අතර එක් සමායතනයක් අත්හදා බැලීමේ පදනමක් මත නිෂ්පාදන කටයුතු අරඹා ඇත.

1964 දී සිමෙන්ති නිෂ්පාදනය ටොන් 79, 508 ක් වූ අතර, 1965 දී ටොන් 84,000 ක් නිපදවිනි. පසුගිය වර්ෂයේ නිමැවුම ඊට පෙරාතු දෙවර්ෂයේදීට වඩා සැල කිය යුතු අන්දමින් වැඩිවූවද, 1962 පැවති ඉහළම නිමැවුම වන ටොන් 85,700 ට වඩා අඩු විය. 1965 දී සිමෙන්ති කර්මාන්තයේ නිමැවුම වැඩිවූයේ නිෂ්පාදනයට එක්වුන නව ශක්තිය නිසා නොව පවත්නා ශක්තිය වඩා හොඳින් උපයෝගී කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙනි. සිමෙන්ති ටොන් 1,50,000 ක් නිපදවිය හැකි අළුත් පෝරණු වක් කන්කසන්තුරේ කර්මාන්ත ශාලාවෙහි දැනට සවිකරගෙන යන අතර 1966 වර්ෂයේදී එය සිමෙන්ති නිෂ්පාදනය සඳහා උපයෝගී කරගත හැකිවේයයි අපේක්ෂා කරනු ලැබේ. දැනට පවත්නා පෝරණුව නවීන ක්‍රමයට සකස් කිරීමෙන්ද නිමැවුම ටොන් 1,10,000 දක්වා වැඩිවනු ඇත. දැනට ඉදිකෙරීගෙන යන ගාලු කර්මාන්ත ශාලාවේ නිමැවුම ටොන් 1,00 000 ක් වේයයි අපේක්ෂා කැරේ. ව්‍යාප්තකිරීමේ කාලජේදය අවසානයේදී කන්කසන්තුරේ සිමෙන්ති කර් මාන්ත ශාලාව, ගාල්ලේ ඇඹැරුම් හා ඇහුරුම් කර්මාන්ත ශාලාව හා පුත්තලමේ දෙවැනි සිමෙන්ති කර්මාන්ත ශාලාව යන මේවායේ ඒකාබද්ධ නිමැවුම ටොන් 3,60,000 ක් වේ යයි අපේක්ෂා කැරේ. දැනට අරඹා ඇති ප්‍රාග්ධන යෝජනාක්‍රම හේතු කොට ගෙන 1966 අවසානය වන විට වාර්ෂික නිෂ්පාදන ශක්තිය ටොන් 2,30,000 දක්වා වැඩිවේයැයි ඇස්තමේන්තු කර ඇත.

ජාතික රෙදි පිළි සංස්ථාවේ කපු නූල් නිමැවුම රාත්තල් කෝටි 0.24 දක්වා රාත්තල් 2,27,000 කින් වැඩිවිය. සීනි සංයුක්ත මණ්ඩලයේ සීනි නිෂ්පාදනය ටොන් 1958 සිට ටොන් 1988 දක්වා අඩුවිය. නැගෙනහිර කඩදාසි කර්මාන්ත ශාලා සංයුක්ත මණ්ඩලයේ කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත නිෂ්පාදනය 1964 දී ටොන් 6,451 ක් වූයේ 1965 දී එය ටොන් 6,696 දක්වා වැඩිවිය. මෙයින් 1965 නිමැවුම ටොන් 245 කින් හා 1962 නිමැවුමට වඩාටොන් 2,000 කින් පමණ වැඩි වීමෙක්ද පිළිබිඹු වෙයි. වර්ෂය තුළදී කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත ආනයනය සීමාකර තිබූ නිසා, කඩදාසි සංයුක්ත මණ්ඩලයට දැනට පවත්නා නිෂ්පාදන ශක්තිය සම්පූර්ණයෙන්ම වාගේ යොදවන්නට සිදුවිය. කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන ශක්තිය ටොන් 9000 ක උපරිම සීමාව දක්වා වැඩිකිරීම සඳහා පසුගිය සිව් වසර තුළදී ආයෝජනය කරන ලද අතර 1965 අවසානයේදී පමණ මෙම ව්‍යාප්ත කිරීමේ වැඩ පිළිවෙළෙහි අවසාන අදියරට එළඹෙනු ලැබිණි. තවද, කඩදාසි බෝඩ් ටොන් 9000 ක් නිපදවිය හැකි යන්ත්‍රයක් සවි කිරීම පිළිබඳව මූලික වැඩ කටයුතු අරඹන ලදී.

පරන්තන්හි රසායන ද්‍රව්‍ය සමායතනයේ ප්‍රධාන නිෂ්පාදිතයන් වන කොස්ටික් සෝඩා සහ ක්ලෝරීන් නිෂ්පාදනය වර්ෂය තුළදී පිළිවෙළින් ටොන් 956 හා ටොන් 265 දක්වා සුළු වශයෙන් වැඩිවිය. මෙම නිෂ්පාදිත දෙකේම නිමැවුම 1964 දීට වඩා වැඩි වූ නමුදු 1963 අනුරූප සංඛ්‍යාවන්ට වඩා අඩුවිය.

සංඛ්‍යා සටහන II (ආ) අං 1

## රජයේ කර්මාන්ත සමායතන 10 ක නිමැවුම 1963-1965

| සමායතනයේ නම | නිමැවුම් ඒකකය | 1963 නිමැවුම | 1964 නිමැවුම | 1965 නිමැවුම |
|---|---|---|---|---|
| 1. ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය .. .. | ටොන් .. .. | 76,764 | 79,508 | 84,000 |
| 2. ජාතික රෙදිපිළි සංස්ථාව .. | කපු නූල් රාත්තල් .. .. | 19,56,976 | 21,84,559 | 24,12,227 |
| 3. ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය. | ටොන් .. .. | 1,467 | 1,958 | 1,888 |
| 4. නැගෙනහිර කඩදාසි කර්මාන්තශාලා සංයුක්ත මණ්ඩලය. .. | ටොන් .. .. | 5,340 | 6,451 | 6,696 |
| 5. පරන්තන්හි රසායන ද්‍රව්‍ය සමායතනය .. .. | කෝස්ටික් සෝඩා ටොන් .. | 985 | 895 | 956 |
| | ක්ලෝරින් ටොන් .. .. | 270 | 230 | 265 |
| 6. ලංකා තෙල් හා මේද සංස්ථාව .. | පොල් තෙල් ටොන් .. .. | 9,467 | 1,961 | 1,514 |
| | පොල්වලින් සෑදූ කෑම සත්ව හා කුකුල් ආහාර ටොන්. | 19,305 | 21,565 | 22,158 |
| 7. ලංකා පිඟන් බඩු සංස්ථාව .. | පිඟන් භාණ්ඩ ටොන් .. | 770 | 888 | 863 |
| 8. ලංකා ඛනිජ වැලි සමායතනය .. | ඉල්මනයිට් ටොන් .. .. | 5,020 | 45,503 | 50,350 |
| 9. ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය .. .. | ක්‍රෝම් වර්ග අඩි .. .. | 5,00,100 | 5,11,310 | 4,73,180 |
| | අනෙකුත් සම් නිෂ්පාදිත රාත්තල් | 2,15,400 | 2,16,300 | 2,00,010 |
| | සපත්තු ජෝඩු .. .. | 1,62,700 | 1,68,430 | 1,88,200 |
| 10. ලංකා තුනී ලෑලි සංස්ථාව .. | වෙළතුනේ තුනී ලෑලි වර්ග අඩි. | 1,35,58,000 | 1,22,15,658 | 1,3969,144 |
| 11. ජාතික සුළු කර්මාන්ත සමායතනය | ගෘහ භාණ්ඩ (රුපියල්) .. | — | — | 43,60,000 |
| | උළු හා ගඩොල් (රුපියල්) .. | — | — | 15,57,951 |
| 12. ජාතික ලුනු සමායනය .. | හොණ්ඩර .. .. | — | — | 3,82,589 |
| 13. ලංකා පොහොර සංස්ථාව .. | ටොන් .. .. | — | — | 92,057(1) |
| 14. ලංකා හාඩ්බෝඩ් සමායතනය .. | නිෂ්පාදනය අරඹා නොමැත | | | |
| 15. ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව .. .. | අත්හද බැලීම් පදනමක් මත නිෂ්පාදනය කෙරේ | | | |
| 16. ලංකා රාජ්‍ය පිටි ඇඹරුම් සමායතනය .. .. | නිෂ්පාදනය අරඹා නොමැත | | | |

සංඛ්‍යා: ඒ ඒ සංස්ථා වලින් ලබාගන්නා ලදී.

(1) දැනට සමායතනය විසින් පොහොර නිෂ්පාදනය කරනු නොලබන නමුදු ආනයන කිරීමේ හා බෙදා හැරීමේ කටයුතුවල නියලෙයි.

## සංඛ්‍යා සටහන II (අා) අා 2

## 1964 හා 1965 දී රජයේ සමායතන විසින් ඉපැයූ ලාභ

### (අවක්‍ර බදු ගෙවීමට ප්‍රථම)

| | සමායතනයේ නම | 1964 ලාභය/පාඩුව රු. | 1965 ලාභය/පාඩුව රු. | 1965 ආයෝජිත ප්‍රාග්ධනය රු. | 1965 ලැබූ ලාභය ආයෝජිත ප්‍රාග්ධන යෙහි සියයට ගණනක් වශයෙන් |
|---|---|---|---|---|---|
| 1. | ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය .. | ලාභ 61, 36, 198 | ලාභ 49,40,000 | 8,87,63,000 | 5·6 |
| 2. | ජාතික රෙදිපිළි සංස්ථාව .. .. | ලාභ 15, 00, 000 | ලාභ 16,00,000 | 4,25,00,000 | 3·8 |
| 3. | ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය .. . | ලාභ 5, 00, 000 | ල. නො | 3,47,00,000 | – |
| 4, | නැගෙනහිර කඩදාසි කර්මාන්ත ශාලා සංයුක්ත මණ්ඩලය .. .. | පාඩු 3, 71, 156 | ලාභ† 1,462, 762 | 1,97,74,667 | 7·4 |
| 5. | පරන්තන්හි රසායන ද්‍රව්‍ය සමායතනය .. | පාඩු 7, 30, 000 | පාඩු 2,08,487 | 90,00,000 | 2·3 |
| 6. | ලංකා තෙල් හා මේද සංස්ථාව .. .. | පාඩු 3, 50, 000 | ල. නො†† | 84,59,903 | – |
| 7. | ලංකා පිඟන් බඩු සංස්ථාව .. .. | ලාභ 5,07,892 | ලාභ 5, 11, 500 | 1,00,00,000 | 5·1 |
| 8. | ලංකා ඛනිජ වැලි සමායතනය .. .. | ලාභ 1,03,000 | පාඩු * * * 3,09,046 | 7,157,149‡ | 4·3 |
| 9. | ලංකා සම් භාණ්ඩ සංයුක්ත මණ්ඩලය .. | ලාභ 4,78,100 | ලාභ 2,57,600* | 35,97,100 | 7·2 |
| 10, | ලංකා තුනී ලෑලි සංස්ථාව .. .. | ලාභ 2,67,800 | ලාභ 2,32,375 | 58,19,545 | 4·0 |
| 11. | ජාතික සුළු කර්මාන්ත සමායතනය .. .. | පාඩු 6,90,000 | පාඩු 8,68,000 | 9,61,560 | – |
| 12. | ජාතික ලුණු සංයුක්ත මණ්ඩලය . .. | – | ලාභ 5,48,083 | 15,00,000 | 36·8 |
| 13. | ලංකා පොහොර සංස්ථාව .. .. | – | ලාභ 5,18,21 1 | 1,13,702 (1) | – |
| 14. | ලංකා හාඩ්බෝඩ් සමායතනය .. .. | නිෂ්පාදනය | අරඹා | නොමැත | – |
| 15. | ලංකා ලෝහ භාණ්ඩ සංස්ථාව .. .. | – | * * | 1,44,42,755 | – |
| 19. | ලංකා රාජ්‍ය පිටි ඇඹරුම් සමායතනය .. | නිෂ්පාදනයඅරඹානොමැත | | 99,04,072 | – |
| 17. | කාර්මික ජනපද සංයුක්ත මණ්ඩලය .. ., | පාඩු 6, 373 | ලාභ††† 40,000 | 70,00,000 | 0·6 |
| | එකතුව .. | ලාභ 73,45,461 | ලාභ 87,24,998 | 26,36,93,453 | 3·3 |

සංඛ්‍යා: ඒ ඒ සංස්ථාවලින් ලබාගන්නා ලදි.
සංඛ්‍යා: තාවකාලික වන අතර විගණනයට යටත්ය.

* බද්දෙන් පසුව

** අත්හදා බැලීමේ පදනමක් මත නිෂ්පාදනය කැරේ.

*** 1966 මාර්තු අවසානය දක්වා බලාපොරොත්තු වූ පාඩුව

‡ 66. 3 31 වැනි දිනට

† කලින් වූ පාඩු නිසා බදු අය නොකරන ලදි.

†† ආන්තික ලාභ අපේක්ෂාකැරේ.

††† 66. 3. 31 වැනි දිනට අවසන් වන කාලච්ඡේදය සඳහා ඇස්තමේන්තුව

ල. නො. ලබා නොමැත.

(1) දැනට සමායතනය විසින් පොහොර නිෂ්පාදනය කරනු නොලබන නමුදු ආනයන කිරීමේ හා බෙදා හැරීමේ කටයුතු වල නියැලෙයි.

ලංකා තෙල් හා මේද සංස්ථාවේ පොල් තෙල් හා තලතෙල් නිෂ්පාදනය 1964 සංඛ්‍යාව වූ ටොන් 1961 සිට 1965 දී ටොන් 1514 දක්වා සැලකිය යුතු අන්දමින් අඩුවී ඇත. 1963 දී අනුරූප නිෂ්පාදනය ටොන් 9467 ක් විය. අනෙක් අතට සත්ව හා කුකුල් ආහාර නිමැවුම ටොන් 21,565 සිට ටොන් 22,159 දක්වා සැහෙන පමණකින් වැඩිවිය. පොල්තෙල් නිමැවුම පහළ වැටුනේ පසුගිය අවුරුද්දේ කර්මාන්ත ශාලාව හා යන්ත්‍රෝපකරණ නඩත්තුව දුර්වලවීම හා සතුටුදායක විදේශීය වෙළඳ පොලක් නොතිබීම හේතු කොටගෙනය. 1962/63 න් පසුව සත්ව හා කුකුල් ආහාර නිෂ්පාදනය ඉතා කැපී පෙනෙන ලෙස වැඩිවී ඇත. මෙයට හේතු වූයේ මෙම අවදියේදී විශේෂයෙන්ම කුකුලන් ඇති කිරීම ඇතුළු පශු කර්මාන්තයේ ව්‍යාප්තවීම නිසා කැටකෑම සඳහා ඉල්ලුම වැඩිවීමය. කුකුල් හා සත්ව ආහාර කර්මාන්ත ශාලාවෙහි දැනට කෙරෙන නිෂ්පාදනය එහි නිෂ්පාදන ශක්තියෙන් සියයට 75 කට ආසන්න වෙයි. ඉකුත් වර්ෂයේදී සාමාන්‍ය නිෂ්පාදනය කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන ශක්තියෙන් සියයට 45 සිට සියයට 50 අතර විය.

1965 දී ලංකා පිඟන් බඩු සංස්ථාවේ නිමැවුම 1964 සංඛ්‍යාව වූ ටොන් 888 සිට ටොන් 863 දක්වා අඩුවිය. මෙසේ අඩුවූයේ සංස්ථාවෙන් නිෂ්පාදනය කරනු ලබන පිඟන් බඩු සඳහා වූ ඉල්ලුම වැඩිවී තිබියදීත්ය. නිමැවුම පහළ වැටුනේ සමහර කාලවලදී පදම්කල මැටි හා පාට වර්ග වැනි ආනයනය කරන ලද අමු ද්‍රව්‍ය ලබාගැනීමට නොහැකිවීම, සේවකයන් වැඩට නොපැමිණීම හා යන්ත්‍රෝපකරණ කැඩීයාම හේතු කොටගෙනය. භාණ්ඩවල තත්ත්වය, මුළු දේශීය ඉල්ලුම් හා ආනයන තහනම් කර තිබීමත් පිළිබඳව සලකා බලන කල මෙම කර්මාන්තයේ නිමැවුම හැකි ඉක්මනින් වැඩි කිරීම සඳහා සැලැස්මක් සකස් කිරීම අතිශයින්ම හිතකරය.

ලංකා ඛනිජ වැලි සමායතනයේ නිමැවුම මුළුමනින්ම ඉල්මනයිට් වලට පමණක් සීමාවූයේ මෙම වර්ෂය තුළදී සැලකිය යුතු වැඩිවීමෙක් පිළිබිඹු විය. 1965 දී ඉල්මනයිට් නිෂ්පාදනය ටොන් 45,503 සිට ටොන් 50,350 දක්වා වැඩිවිය. ඉල්මනයිට් නිෂ්පාදනය අලෙවි කොන්ත්‍රාත්තු මත රඳා නොපවතී. වැලි වලින් ගරාගනු ලබන ඉල්මනයිට්, ගබඩා පහසුකම් ලැබෙන තෙක් ගොඩගසා තබාගනු ලැබේ. එහෙයින් නිෂ්පාදනය ඉහළ ගියද අලෙවියද එපමණකින්ම වැඩිවූයේයයි කිව නොහැකිය. රූටයිල් හා ස්කෝන් නිෂ්පාදනය කිරීමෙන් නිමවුමෙහි නානා අංග ඇති කිරීමට සමායතනය බලාපොරොත්තු වෙයි.

1965 දී ලංකා සම් භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ ක්‍රෝම් සම් හා අනෙකුත් සම් නිෂ්පාදිත නිමැවුම සැලකිය යුතු අන්දමින් පහළ වැටුන නමුදු සපත්තු නිමැවුම ජෝඩු 1,69,490 සිට 1,88,200 දක්වා වැඩිවිය. සංයුක්ත මණ්ඩලයේ දැනට පවත්නා උපකරණ වලට නිමැවුම වැඩි කිරීමට සෑහෙන ශක්තියක් ඇති නමුදු මෙරට සම් ලබා ගැනීමට නොහැකි වීමෙන් නිෂ්පාදනයේ වැඩිවීම සීමා වී ඇත. සංයුක්ත මණ්ඩලයේ නිමැවුම වැඩි කිරීමට නම් එයට සම් ආනයනය කිරීමට සිදුවන බවට ලකුණු පෙනීයයි.

### මිල හා ලාභදායකත්වය

ඒ ඒ කාර්මික සමායතනයේ ලාභාලාභ II (ආ) ආ 2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. ඉකුත් වර්ෂයේ මෙන්ම මේ වර්ෂයේදී ද සිමෙන්ති, ජාතික රෙදිපිළි, නැගෙනහිර කඩදාසි කර්මාන්තශාලා, ලංකා පිඟන් බඩු, සම් භාණ්ඩ හා තුනී ලෑලි, යන සංස්ථා ලාභ උපයා ඇත. ඉකුත් වර්ෂයේ ලැයිස්තුවට ඇතුලත් නොවූ සමායතන අතුරින් ලංකා පොහොර සංයුක්ත මණ්ඩලය මෙම වසරේදී ලාභ ලැබුවේය. රුපියල් 40,000 ක ලාභයක් ඉපයූ කාර්මික ජනපද සංයුක්ත මණ්ඩලය හැර අනෙකුත් සමායතන වලට ඉකුත් වර්ෂයේදී මෙන්ම මේ වර්ෂයේදී ද අලාභ විඳීමට සිදුවිය. පරන්තන්හි රසායන ද්‍රව්‍ය සමායතනයට එහි අලාභය රු. 7,30,000 සිට රුපියල් 2,09,487 දක්වා අඩුකර ගැනීමට හැකිවූ අතර 1964 දී රුපියල් 1,03,000 ක ලාභයක් ඉපැයූ ඛනිජ වැලි සමායතනයට මෙම වර්ෂයේදී රු. 3,09,046 ක අලාභයක් සිදුවිය. 1964 දී රුපියල් කෝටි 0·69 ක ලාභයක් ඉපයූ ලංකා සිමෙන්ති සංයුක්ත

මණ්ඩලය මෙම වර්ෂයේදී ලැබූ ලාභය රුපියල් කෝටි 0·49 දක්වා අඩුවිය. ලංකා සම් භාණ්ඩ සංයුක්ත මණ්ඩලය ද ලංකා තුනී ලැලි සංස්ථාව ලැබූ ලාභ ප්‍රමාණයන්ද සැලකිය යුතු අන්දමින් අඩුවිය. නැගෙනහිර කඩදාසි කර්මාන්තශාලා සංයුක්ත මණ්ඩලයේ කාර්ය සාධනයෙහි කැපී පෙනෙන දියුණුවක් දක්නට ලැබිණි. 1964 දී රුපියල් 3,71,156 ක අලාභයක් ලැබූ මෙම සංයුක්ත මණ්ඩලය 1965 දී රුපියල් කෝටි 0·15 ක ලාභයක් ලැබීමෙන් එම දියුණුව මැනවින් පිළිබිඹු විය.

ඒකකයක නිෂ්පාදන වියදම සැලකිය යුතු ලෙස වැඩිවීම හේතු කොටගෙන ලංකා පිගන් බඩු සංස්ථාවේ ලාභ වැඩිවීමේ අනුපාතිකය සැලකිය යුතු තරම් නොවීය. එසේ වුවද, පවත්නා සැපයුම් හිඟය පිළිබිඹු කරමින් පිගන් බඩුවල සිල්ලර මිල ඉහළ මට්ටමක පැවතුන නමුදු සංස්ථාවේ විකුණුම් මිල අවුරුදු ගණනක් තිස්සේ නොවෙනස්ව පැවතිණි. ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයේ ලාභ පහළ වැටීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ සිමෙන්ති නිෂ්පාදන වියදම වෙනස් වීමය. නිදසුනක් වශයෙන්, 1964 දී රුපියල් 114 ක් වූ සිමෙන්ති ටොන් එකක සාමාන්‍ය නිෂ්පාදන වියදම 1965 මුල් කාර්තුවේදී රුපියල් 137 ක්ද, තෙවැනි කාර්තුවේදී රුපියල් 118 ක් ද වූයේය 1965 මැයි මාසයේ සිට බල පැවැත්වෙන පරිදි සිමෙන්ති ටොන් එකක ප්‍රමිත සිල්ලර මිල රුපියල් 180 සිට රුපියල් 190 දක්වා වැඩි කරන ලදි. කෙසේ වුවද, පවත්නා නිමැවුම් මට්ටම අනුව සිමෙන්ති නිෂ්පාදන කර්මාන්තයෙහි වියදම් පහළ වැටීමේ ප්‍රවණතාවයක් ඇති නොවන බැව් වර්තමාන හැඩගැස්මෙන් පෙනී යයි. වර්ෂය තුළදී සිල්ලර විකුණුම් මිල වැඩිවූ බවද එයින් පැහැදිලි වෙයි. වර්ෂය තුළදී, නැගෙනහිර කඩදාසි කර්මාන්ත ශාලා සංයුක්ත මණ්ඩලයේ කඩදාසි නිෂ්පාදිතවල නිෂ්පාදන වියදම ඉතා ස්ථාවර ලෙස පැවතිණි. නිමැවුම වැඩිවීමෙන් ඒකක වියදම අඩුවූ නමුදු ආනයනය කරන ලද සමහර අමු ද්‍රව්‍ය හා රසායන ද්‍රව්‍යවල මිල වැඩි වීමෙන් එය තරමක් දුරට මැකී ගියේය. සමායතනය විසින් එහි නිෂ්පාදිත සඳහා මිල නියම කරනු ලබන්නේ ඊට සමාන වූ ආනයනය කරන ලද අවසාන නිෂ්පාදිත සඳහා යන වියදම අනුවය. දේශීය නිෂ්පාදනයෙන් ලබන ලාභයෙන් කොටසක් අභ්‍යාස පොත් වැනි සමහර ශීර්ෂ වල මිල ස්ථාවරව තබා ගැනීම සඳහා උපයෝගී කරගනු ලැබේ. ලංකා තුනී ලැලි සංස්ථාවේ මිල නියම කිරීමේ ප්‍රතිපත්තිය වර්ෂය තුළදී නොවෙනස්ව පැවතුනේය. නිෂ්පාදන වියදම වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ මූලික අමු ද්‍රව්‍ය වන ලී මිල වැඩිවීමය. 1965 දී තෙල් හා මේද සංස්ථාව එහි භාණ්ඩවල මිල නියම කළේ අමු ද්‍රව්‍යවල සාමාන්‍ය වියදමට සාධාරණ ලාභාන්තිකයක්ද එක් කිරීමෙනි. සංස්ථාවේ විකුණුම් මිල වර්ෂය තුළදී නොවෙනස්ව පැවති නමුදු නිෂ්පාදන වියදම ඉහළ ගියේය. සම් භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ නිෂ්පාදිත සඳහා මිල නියම කරනු ලබන්නේ පෞද්ගලික අංශයේ ව්‍යාපාරික ආයතන විසින් නිපදවනු ලබන සාපේක්ෂ නිෂ්පාදිතවල මිල අනුවය. තරගය හේතු කොටගෙන විවිධ නිෂ්පාදිතවල ලාභාන්තිකයන් සැලකිය යුතු අන්දමින් වෙනස්වෙන බවක් දක්නට ලැබිණි. නිමැවුම් ව්‍යාප්තියත් සමගම වියදම් අඩුවීමේ ප්‍රවණතාවයක් ද ඇතිවිය.